සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, සයවැනි කලාපය, පිටු 17-44
ISSN 1800-1459

කාන්ටියානු විශ්වීය නීතිය හා නිදහස පිළිබඳ ස්වාමි හැඟවුම දේශපාලනික ගුප්ත ඒජන්තයෙක් ලෙස: 'කැසබලන්කා' චිත්‍රපටය ආශ්‍රිත ව සාකච්ඡාවක්

මහේෂ් හපුගොඩ

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය

සාරාංශය

ලියොතා-හබර්මාස් සංවාදයේ දී විශ්වීය වටිනාකම් මෙන් ම නූතන පදනම් පිළිබඳ නිශ්චිත අර්ථයන් සම්පාදනය කිරීම අධිපතිවාදී, කතිතාවකට මඟ පාදන හෙයින්, එවැනි තත්වයක් නිර්මාණය කිරීම ලියොතාදියානු අර්ථයෙන් ප්‍රතික්ෂේප වුව ද, නූතනත්වයේ වටිනාම අන්තර්ගතය ලෙස මානව නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනීමට සිදු වේ. මානව අයිතිවාසිකම්, සමානාත්මතාව, පුද්ගල නිදහස, ප්‍රගතිය කරා පරිණාමය වන සමාජයක් පිළිබඳ කතිකාව, ප්‍රජාතන්ත්‍රවාදය හා ඒ වෙනුවෙන් සටන් කිරීම වැනි විශ්වීය වටිනාකම් හා ඒ පිළිබඳ දැනුවත් භාවය මෙන් ම එය අනිකාට සන්නිවේදනය කිරීම, මිනිසා වඩා හොඳ ලොවක් තනාගැනීම පිළිබඳ ව වන්නා වූ ඓතිහාසික අරගලය හා සම්බන්ධ වූ මිල කළ නොහැකි දේශපාලනික දෘෂ්ටිවාදී ගොඩනැංවීම් මිනිසාගේ අවියෝජනීය නූතන උරුමයක් වේ.

වටිනාකම් යනු දැනටමත් මිනිස් ශිෂ්ටාචාරය තුළ ගොඩනැගී ඇති සංඝටකයන් බැවින් මිනිසා ඉතා දුෂ්කර තත්වයන් තුළ වුව ද එම වටිනාකම් සමඟ සවිඥානික ව මෙන් ම අවිඥානිකවත් අනන්‍යවන බැවින්, මතුපිට හැඟවුම් කුමක් වුවත්, අදාළ විශ්වීය වටිනාකම් ගුප්ත ලෙස මිනිසා නියාමනය කරයි. අධිපතිවාදී රාජ්‍යය, ත්‍රස්තය හා මර්ධනය හා නොඉවසීම නො දැනුවත්වීම් මෙන් ම ස්ත්‍රිය හා වසඟකාරීත්වය, පුද්ගල ආශාව, වෙළඳපළකරණය වැනි සාධක තුළ පවා මිනිසාගේ නිදහස පිළිබඳ ආශය හා තමාට අවේණික අයුරකින් නිදහස නම් ස්වාමි හැඟවුම සමඟ මිනිසා විශ්වීය ලෙස අනන්‍යවීම පිළිබඳ සම්භාව්‍ය කාන්ටියානු-හබර්මාසියානු උදාහරණයක් ලෙස මයිකල් කර්ටිස්ගේ කැසබලන්කා නම් විශිෂ්ට හොලිවුඩ් චිත්‍රපටය සාකච්ඡා කිරීම මෙම පත්‍රිකාවේ අභිප්‍රාය යි.

කේන්ද්‍රීය වචන: විශ්වීයත්වය, නිදහස පිළිබඳ ස්වාමි හැඟවුම, අචාරධාර්මීය මිනිසා හා වගකීම

හැඳින්වීම

විශ්වීය වටිනාකම් හා එම වටිනාකම් සමඟ එකඟතාවකින් (solidarity) කටයුතු කිරීම පිළිබඳ ව, සම්ප්‍රදායික වමේ කඳවුරේ බිඳවැටීම මෙන් ම ෆුකුයාමා වාදය (thesis) පාදක කර ගනිමින් දිගහැරෙන බහු-සංස්කෘතික මතවාදය තුළ, පසුගිය දශක කිහිපය තුළ වර්ධනය වූ මතවාදී කුකුස් හා සංකාවන් නිසා එවැනි තත්වයන් පිළිබඳ කතිකාව බරපතල ලෙස පසුබෑමට හා අධෛර්යයට පත් කරනු ලැබ ඇත. ලියොතා කතිකාව විසින් (1984: 02) නිශ්චය කරන ලද 'මහා අඛ්‍යානයන්ගේ බිඳ වැටීම' හා එවැනි අඛ්‍යාන විසින් අපේක්ෂා කරන ලද මිනිසාගේ උසස් විමුක්තිය (higher freedom) පිළිබඳ උත්කෘෂ්ටවත් නූතන ප්ලැටෝනියානු හැඟවුම හා සමාන්තර ගත වූ කාන්ටියානු විශ්වීය මිනිස් වටිනාකම් හා වගකීම්

(values and duties) හා ඒ වෙනුවෙන් අරගල කිරීම වෙනුවට තනි පුද්ගල පැවැත්ම හා බැඳුණු සුවිශේෂී අනන්‍යතා සමකාලීන තාක්ෂණ පාරිභෝගික සමාජයේ අර්චන අනන්‍යතා වස්තූන් (fetish objects) හා වඩවඩාත් සහයෝගී විය. මෙම පශ්චාත් නූතන දෘෂ්ටිමය තත්වය ඇත්ත වශයෙන් දාර්ශනික ගොඩනැගීමකට වඩා ධනවාදයේ වර්ධනය හා සම්බන්ද වූ ද්‍රව්‍යමය තත්වයක කැඩපතක් විය. වෙනත් විදියකින් කිවහොත් පශ්චාත් නූතන තත්වය යනු සමකාලීන දර්ශනයේ තවත් සංවර්ධනයකට වඩා ධනවාදයේ අසීමිත තාක්ෂණ දියුණුව ඉදිරියේ ඇති වූ නව තත්වය හමුවේ සිදු වූ නිරීක්ෂණමය පසුබැසීමකි. ඒ අනුව මිනිසාට තවදුරටත් එකට එකතු වී අරගල කළ හැකි භාෂාවක් හා දෘෂ්ටිවාදයක් අවම වශයෙන් විසිවෙනි සියවසේ අග භාගයේ දී දක්නට නොලැබුණු අතර බොහෝ වාමාංශිකයන්, විමුක්තිවාදී ක්‍රියාදරයන් හා සමාජ වෙනසක් අදහස් කළ රැඩිකල් බුද්ධිමත්හු බොහෝ විට මෙම ක්‍රමයේ ප්‍රේක්ෂකයින් බවට පමණක් පත් වූහ. එවක් පටන් ගෝලීය ධනවාදය එක පිම්මේ වර්ධනය වූ අතර ඒ මඟින් ජනනයකළ අව-මානුෂිකත්වය (de-humanization) දෘෂ්ටිමය අභියෝගයකින් තොර ව නිදැල්ලේ යන ලදී. එක් අතකින් සමකාලීන ධනවාදී සමාජය අවසාන විග්‍රහයේ දී අසීමිත ලෙස ධනය රැස් කරගත් කිහිප දෙනෙක් හා ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ පමණක් නොව දියුණු ධනවාදී කේන්ද්‍රයේ ද අන්ත දුප්පත් ලෙස කොන්ගත වූ බිලියන ගණනක් වූ මිනිසුන්ගෙන් පිරී ධ්‍රැවීකරණය වී ඇතුවාට අමතර ව 'සියලු සබුද්ධික මිනිසුන්ට අනන්‍ය විය හැකි' (කාන්ට් 1964: 121) විශ්වීය වටිනාකම් මෙන් ම සනාතන සත්‍යයන් පිළිබඳ ව අත්‍යවශ්‍ය අවධානය බහු-සංස්කෘතික කතිකාව හා තාක්ෂණ හුදකලාභාවය (technological isolation) විසින් මෑත කාලය තුළ විතැන් කරන ලදී.

මේ කාරණය මත මිනිසාගේ ක්‍රියාව හා වගකීම පිළිබඳ විශ්වීය සාධාරණීකරණයන් ගැටලුකාරී වූ අතර, ඒ සඳහා සියලු සබුද්ධික ජීවීන් ඉක්මවා ගමන් කළ හැකි (overiding all rational beings) ආචාර ධාර්මික විශ්වයක් (moral universe) සම්බන්ධ අනුගතවීමක් න්‍යායික ව රැගෙන ඒම අපහසු විය. බටහිර ශිෂ්ටාචාරයේ මූලික අචාර ධාර්මික හා දාර්ශනික පදනම් ප්‍රශ්න කිරීමේ දී නීට්ෂේත් සාන්දෘෂ්ටිකවාදීනුත් ඉන් පසුව බලය, බල ආයතන හා දැනුම යන ගොඩනැංවීම්වල මර්ධනීය සාධක සාකච්ඡා කිරීමේ දී මිෂෙල් ෆුකෝත්, ඉනුත් අනතුරුව මහා අඛ්‍යාන මත ගොඩනැංවූ නූතන ශිෂ්ටාචාරයේ නො-වලංගුභාවය ලියෝතා විසින් නිරීක්ෂණය කිරීමත් යන කරුණු මෙන් ම තාක්ෂණය පදනම් කර ගත් මාධ්‍ය විසින් ගොඩනංවන ලද 'ප්‍රතිරූප' තුළ සැබෑව හා ව්‍යාජය අතර වෙනස තීරණය කර ගැනීමට මිනිසාට ඥාන විභාගාත්මක ව නොහැකිවීමත් අප අධියථාර්ථ මාධ්‍ය ප්‍රතිරූප බහුත්වයක් අතරමැද තෝන්තු වී සිටීම නිරීක්ෂණය කළ බ්‍රෝදිලාද්ගේ අසීමිත නාස්තිකවාදී දර්ශනය තුළත් දිගින් දිගට ම නූතන මිනිසාගේ සුවිශේෂී මතවාදී ගොඩනැංවීම් අර්බුදයට නැංවීමට නැත්නම් අවම වශයෙන් පසුපසට තල්ලු කිරීමට සමත් විය. ලිබරල් ධනවාදයේ පරම උත්කර්ෂය ෆුකුයාමා සනිටුහන් කළාට පසු ලෝකය අර්ථකතනය කිරීම හෝ වෙනස් කිරීම යන්න දෘෂ්ටිමය ලෙස අවසන් වුවා සේ සලකන ලදී. එනිසා ඉදිරි දේශපාලනය තීරණය විය හැකි එකම සාධකය ෆුකුයාම නිවැරදි ද වැරදි ද යන ප්‍රශ්නයට දෙන පිළිතුරෙන් පමණක් ආරම්භ වන බව ලෙස ජිජැක්(2011:02) දක්වන්නේ

මෙම දෘෂ්ටිමය වැදගත්කම ඉස්මතු කරනු සඳහා ය. විශ්වීය වටිනාකම්වල වලංගුතාව ප්‍රශ්න කිරීමත් එම වටිනාකම් මිනිස් භාවිතාවන් සමග ගලපා ගැනීම පිළිබඳ අචාරධාර්මීය ගැටලුව නොවිසඳී පැවතීමත් සමග ම අද්‍යතන සමාජය පෙර නොවූ විරූ අකාරයෙන් පරිණාමයට ලක්වෙමින් පවතී. මෙය සිදුවන්නේ ධනවාදී සංස්කෘතික අධි-තාක්‍ෂණය හරහා ය.

මිනිසාගේ අතිමූලික මනෝ ලිංගික කලාප හරහා ගමන් කරන අධි තාක්‍ෂණ මෙවලම් විසින් මිනිසා ආශාව මෙන් ම ආශාව හරහා මිනිසා බාහිර සමාජයට සංස්කෘතික ව අනුගත වීම යනු ඉතා වැදගත් සමාජීය ක්‍රියාවල පැවැත්ම අවලංගු කරමින් පවතී. හුදු ලාභය සඳහා පමණක් මිනිසාට අවශ්‍ය කරන නිෂ්පාදනයන් නොව මෙවන් ප්‍රති-නිෂ්පාදනයන් අරමුණු කර ගත් ආර්ථික උපක්‍රම හරහා දියුණු ධනවාදී සමාජයන් පසුගිය දශකය වන විට අත්වින්දේ නිර්-නිෂ්පාදනකරණය යි (de-industrialization). නිෂ්පාදනයෙන් සේවා ආර්ථිකයට මාරුවීමේ ප්‍රතිඵලය ලෙස විශාල පුහුණු ශ්‍රමිකයන් පිරිසකගේ රැකියා අහිමි විය. ඔවුන්ගේ මිල දී ගැනීමේ හැකියාව අවම විය. ජීවන වියදම් ඉහළ ගියේ ය. ආර්ථිකයන් එක තැන පල්වන තත්වයට පත්විය. දැවැන්ත ලෙස ව්‍යාප්ත වන විනෝදය මුල් කර ගත් ගෝලීය සේවා ආර්ථිකය වෙනුවෙන් වඩ වඩා බලශක්තිය අවශ්‍ය වෙමින් ඇත.

එමෙන් ම ජිජැක්(2011:2) දක්වන ආකාරයට අද්‍යතන ලිබරල් ධනේශ්වර සමාජ සැකැස්මෙහි තිරසාර බව (sustainability) මෙන් ම මානව පැවැත්ම ඉතාම තීරණාත්මක අවධියකට ළඟා වී ඇති බව අපට ගෝලීය ව මේ මොහොතේ නිරීක්‍ෂණය කළ හැකි ය. සුරා කෑම, දරිද්‍රතාව, ආර්ථික අසමානතාව හා නිර්-ප්‍රජාතන්ත්‍රීය පාලන ව්‍යුහයන් මානව හිමිකම් කඩවීම්, ජනතා නැගිටීම් ප්‍රචණ්ඩකාරී ලෙස මර්ධනය කිරීම් හා කේන්ද්‍රය හා පරිධිය අතර දුරස්වීම් මෙන් ම පරිධියේ ඇතිවෙමින් පවතින මූලධාර්මික ත්‍රස්තය, පරිසර ප්‍රශ්න වැනි කරුණු පදනම් කර ගනිමින් ලෝකය වඩාත් අස්ථිර, අනාරක්‍ෂිත මෙන් ම ජීවත්වීමට නොසුදුසු (unconducive) තැනක් බවට පත්වෙමින් තිබේ. ලිබරල්-ධනවාදයේ කේවල උත්කර්ෂණය (absolute sublimation) මතින් ඉතිහාසය අවසාන යැයි ලියූ ෆුකුයාමාවාදීන් ගෝලීය ලිබරල් ධනවාදය හරහා ශේෂකර ඇති මහා පරිමාණ ගැටලු හා ලෝකය ළඟාවෙමින් ඇති අපොකලිප්ටික අවසානය (apocalyptic end) පිළිබඳ ව සවිඥානික වීම අද දවසේ වහා විසඳුම් සපයාගත යුතු අවශ්‍යතාවක් නොවන්නේ ද? ඇත්ත වශයෙන් එය මානව ශිෂ්ටාචාරයේ වැදගත් ම හා කඩිනම් අවශ්‍යතාවක් වෙමින් පවතී. අප ගිලී ඇති හුදකලා, අති-පෞද්ගලිකකරණය වූ ඩිජිටල් පාරිභෝගික විනෝදය වෙනුවට මානව ශිෂ්ටාචාරයේ වටිනාකම් හොඳ නරක හා මැදිහත්වීම පිළිබඳ වගකීම සම්බන්ධයෙන් තවදුරටත් බැරෑරුම් ව සිතා බැලීමට මේ මොහොත අපට බල කර සිටී.

යහපත හා අයහපත අතර ආචාරධාර්මික බද්ධමකඩනය, විශ්වීය වටිනාකම් විසින් මෙහෙයවනු ලැබූ මිනිසා හා ඔහුගේ ක්‍රියාව, සියලු සබුද්ධික ජීවීන් එකට බැඳ තබන වටිනාකම්වල අවශ්‍යතාව (ඒකරාශිවීමේ ස්වාමි හැඟවුම්) නිර්ණය කිරීමේ දී මිනිසා තම වගකීම නිශ්චය කිරීමේ දී මෙන් ම තම ක්‍රියාව තීරණය කිරීමේ දී ඔහුට ම ආවේණික ආකාරයකින් එක් නිශ්චිත ස්වාමි හැඟවුමක්

විසින් එක් විශ්වීය ස්වාමි හැඟවුමක් විසින් මෙහෙය වනු ලැබීම යන කරුණ සලකා බැලීම සම්බන්ධයෙන් සම්භාව්‍ය උදාහරණයක් ලෙස මයිකල් කර්ටිස්ගේ 'කැසබලන්කා' නම් හොලිවුඩ් චිත්‍රපටය, මෙම ලිපියේ දී සාකච්ඡා කෙරේ. ව්‍යාකූල අවස්ථාවන්හිදී (chaotic situations) පොදු අවකාශය තුළ පුද්ගල කාර්යභාරය හා වගකීම තීරණය කිරීම කෙරෙහි සටන්කාමීත්වය හා ස්වාමි හැඟවුම මිනිසුන් එකට බැඳ තැබීම අතර වන නොපෙනෙන සම්බන්ධය කාන්ටියානු අචාරධර්මීය න්‍යායන් ආශ්‍රයෙන් සලකා බැලීමක් ද මෙහිදී සිදු කෙරේ. දේශපාලන සන්දර්භයක දී මතු සඳහන් විශ්වීය ස්වාමි හැඟවුම් තුළ ව්‍යුහාත්මක ව ගණුදෙනු කරන මිනිසුන්ගේ තනි පුද්ගල චර්යා අභිබවා පොදු සාධක මතු වුවත්, තනි පුද්ගලයන් ලෙස මිනිසුන් ඒකරාශි වන ආකාරයත්, එය ද අරගලයේ දී සටන්කාමීත්වයක් ලෙස හඳුනා ගත හැකි වීමත්, හැඟීම්වලින් පෙළඹවනු ලදුව ආවේගශීලී ව මෙම අධිපති පද්ධතියකට එරෙහි ව කරන විරෝධාකල්පිත ප්‍රතිචාරයක් ලෙස රැඩිකල් හැඟිම් උද්දීපනය වීම ජනප්‍රියකරණය තුළ වැදගත් වුවත් වඩා සබුද්ධික, දැනුවත්, සංයුක්ත ක්‍රියාකාරීත්වයක් වඩා ඵලදායක වන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් මෙහි දී සාකච්ඡාවට බඳුන් කෙරේ. ඇතැම් ලාංකික ප්‍රතිචාරාත්මක රෝමැන්ටික (Romantic) රැඩිකල්කාමී අදහස් මතවාදී ව අවරෝධය කෙරෙහි මෙම චිත්‍රපටයේ තේමාව, චරිත හා ව්‍යුහාත්මක ගොඩනැංවීම් සමකාලීන දෘෂ්ටිමය භාවිතය හා අදාළ ව තේරුම් ගන්නේ කෙසේ ද යන්නත් එහිදී සාකච්ඡාවට බඳුන් කෙරේ. වඩා සබුද්ධික හා සංවිධිත ලෙස සංකීර්ණ මිනිසා ක්‍රියාධරයින් කටයුතු කිරීම තේරුම් ගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ආලෝකයක් ද මෙම චිත්‍රපටය හරහා උකහා ගැනීමට උත්සාහ කෙරේ. එමෙන් ම පශ්චාත් පුනරුද මිනිසා පිළිබඳ කාන්ටියානු හබමාසියානු කතිකාව, මිනිසාට විමුක්තිය ළඟා කරදීම් ක්‍රියාවලියේ දි ඓන්ද්‍රිය සීමාකම් හා නොහැකියාවක් පෙන්වන, නිරීක්ෂණය පශ්චාත් නූතනත්වයට සාපේක්ෂ ව කෙතරම් වැදගත් වේ ද යන්නත් මෙහි දී චිත්‍රපටයේ අන්තර්ගතය ආශ්‍රිත ව සාකච්ඡාවට භාජනය කෙරේ.

සාහිත්‍ය විමර්ශනය

කැසබලන්කා චිත්‍රපටය පිළිබඳ ව පර්යේෂණ මාදිලියේ රචනා ඇත්තේ අල්ප වශයෙන් වුව ද ඒ පිළිබඳ ව ලියැවුණු හා චිත්‍රපටය ආශ්‍රයෙන් සකස් වී ඇති ව්‍යුහාත්මක විශ්ලේෂණයන් කිහිපයක් මෙහිදී සඳහන් කළ හැකිය. ඉන් එක් ප්‍රධාන ලියවිල්ලක් නම් උම්බර්තෝ ඊකෝ විසින් ඉදිරිපත් කර ඇති Cult Movies and Intellectual Collage (1985) නම් පර්යේෂණ පත්‍රිකාවයි. චිත්‍රපටයේ ඓතිහාසික සන්දර්භය හා අමෙරිකානු සංස්කෘතිය තුළ එහි වැදගත්කම සාකච්ඡා කරන මෙම ලියවිල්ල මඟින් කැසබලන්කා චිත්‍රපටය හා එහි තේමාව හම්ප්‍රි බොගාට් යන චරිතය අමරිකන් සංස්කෘතිය තුළ මෙන් ම ගෝලීයවත් උපසංස්කෘතික ලබ්ධි (cult) වන්දනීය බවක් අත් කරගත්තේ කෙසේ ද යන්න සාකච්ඡා කරයි. මීට අමතර ව මෙම චිත්‍රපටයේ නිරූපණය කර ඇති සුවිශේෂ අවස්ථා කිහිපයක් ස්ලොවෝයි ජිජැක්ගේ නිරීක්ෂණයට ලක්වෙයි. මින් එක් අවස්ථාවක් නම් වීසා පත් ලබා ගැනීම සඳහා එල්සා රික් හමුවීමට එන අවස්ථාවයි. ලැස්ලෝ යම් දේශපාලන සාකච්ඡාවක් සඳහා නික්ම ගිය පසු එල්සා රික් හමුවීමට අවන්හලට පැමිණි පසු ඔවුන් අතර වන සංවාදය අතරතුර

එල්සා සිය පිස්තෝලය පෙන්වා රික්ගෙන් වීසා පත් ඉල්ලා සිටී. රික් නිර්භයව තමා මිය යෑම වඩා සැපතක් බව කියමින් ඉදිරියට පැමිණේ. එම ක්‍රියාවෙන් මෙන් ම අතීත ස්මරණයන් ඔස්සේ ඉතා අසරණ ව ඇඳ වැටෙන එල්සා රික්ගේ උරහිසට වාරු වේ. චිත්‍රපටයේ කැමරාව ප්‍රදීපාගාර කුළුණ වෙත හැරවී ආපසු එන විට දෙදෙනා කිසිදු වෙනසක් නැතිව පෙරසේ ම අප හමුවේ පෙනී සිටිති.

> "ප්‍රදීපාගාර කුළුණ මෙන් ම නැවත කැමරාව ඔවුන් දෙදෙනා වෙත එල්ලවන විට රික් දල්වා සිටින සිගරැට්ටුව ලිංගික සංකේත ලෙස හඳුන්වන ජිජැක් තවදුරටත් කියන්නේ සිගරැට්ටුව ලිංගික ක්‍රියාවෙන් පසු ආතතිය තුනී කර ගැනීමේ උපකරණයක් ලෙස හොලිවුඩ් සිනමාව භාවිත කරන පොදු ප්‍රායෝගයක් ලෙසයි" (ටේලර් 2011:39).

මෙයින් අර්ථවත් වන්නේ ඔවුන් දෙදෙනා ලිංගිකව එකතු වූ බව අපට සංකේතීය ලෙස හොලිවුඩ් සිනමාව ගෙන එන අතර චිත්‍රපටයේ දර්ශන විසින් එවැන්නක් ගම්‍යමාන නොකරන බවයි. එසේ වුව ද ගැඹුරු ආදරණීය සම්බන්ධයක් තුළ චිත්‍රපටය ලිංගිකව ඔවුන් එකතුවන දර්ශනයක් ඇතුළත් වුව ද එහි නොගැලපීමක් නැත. නමුත් එල්සා ලැස්ලෝට කරන ආදරය තුළ එවැන්නක් සදාචාරවත් වන්නේ ද නැත. එහෙත් රික් හා එල්සා තම හැඟීම්බර මතකයන් හා අරගල කරමින් මියයෑමට තරම් සූදානමක් ඇති සන්දර්භයක් තුළ හා අවසානයේ එල්සා රික් හා ජීවත් වීමට තීරණය කිරීමේ තත්වයන් තුළ එවැනි එකතුවීමක් සාධාරණීකරණය කළ නොහැකි වන්නේ ද නොවේ. නමුත් ජිජැක් දක්වන ආකාරයට හොලිවුඩ් සිනමාවේ ගැටලුව ඉහත තත්වයන් නොවේ. මෙහිදී හොලිවුඩ් සිනමාකරු කරන්නේ අපගේ අශ්ලීල ෆැන්ටසි පරිකල්පණය සුරාකෑමයි. එනම් රික් හා එල්සා භෞතික ව ළංවන අවස්ථාවේ ඔවුන්ගෙන් කැමරාව ඉවත්කර එය ප්‍රදීපාගාර කුළුණ වෙත එල්ල කර නැවත ඔවුන් කරා කැමරාව ගෙන එන අවස්ථාවේ ඔවුන් පෙර පරිදිම (ඇඳුම් හා විලවුන් පවා කිසිදු වෙනසකට ලක් නොකර) අප වෙත දර්ශනය කිරීමෙන් ඔවුන් ලිංගික ව හැසිරෙන්නට ඇත් ද නැද්ද යන කුකුස ප්‍රේක්ෂකයා තුළ ඇතිවීමට චිත්‍රපට කරු ඉඩ හරී. ඇඳුම් මැත් නොවී සිටීම වැනි කාරණා නිසා ප්‍රේක්ෂකයා 'ඔවුන් එසේ නොකරන්නට ඇත' (They didn't do it) යනුවෙන් සිතනවිට ම රික් සිගරැට්ටුවක් දැල්වීම නිසාත් එය හොලිවුඩ් සිනමාවේ ලිංගික ක්‍රියාවෙන් පසු යෙදෙන සංකේතයක් වන නිසාත් 'ඔවුන් එසේ කරන්නට ඇතැ'යි (They did it) යන තත්වයන් දෙක අතර තබා අපගේ අශ්ලීල ෆැන්ටසි පරිකල්පනය කරා අප ගමන් කරවයි. මින් පසු අපට අවශ්‍ය දෙයක් අපට සිතා ගත හැකියි. චිත්‍රපයේ අශ්ලීලත්ව සූරාකෑම මෙයයි.

ජිජැක්(1989: 109-110) කැසබලන්කා චිත්‍රපටය පිළිබඳ ව රැගෙන එන අනෙක් නිරීක්ෂණය නම් හම්ප්‍රි බොගාට් (රික්) නම් චරිතය මෙතරම් ජනප්‍රිය වූ තම මිත්‍රත්වය වෙනුවෙන් ගැහැණිය යන්න කැපකිරීම නම් උත්කෘෂ්ඨ හේතුවයි. අසංස්ථිත (inconsistent) හිස්ටෙරික ගැහැණියගෙන් ඈත්වීමට හා එවන් ගැහැණියට දක්වන භීතිය පාදක කර ගත් ඓතිහාසික සාහිත්‍යය (එඩ්වඩ් මන්ක්ගේ සිට කැෆ්කා දක්වා) පාදක කර ගනිමින් ඔටෝ විනින්ගර් (Otto Weininger) නම් දර්ශනිකයාගේ Sex and Character (දාතම රහිතයි) නම්

කෘතිය හරහා තර්ක කරන ජිජැක් 'ෆැල්ලසයෙන් ඔබ්බට ගමන් කළ හැක්කේ පිරිමියාට පමණක්' යන විනිත්ගරියානු ප්‍රකාශය ඔස්සේ ව්‍යුත්පන්න කර ගන්නා 'ගැහැණියට ප්‍රවේශවිය හැක්කේ අනෙකාගේ (ෆැලික නොවන) විනෝදයට පමනක්' නම් මනෝ විශ්ලේෂී නිගමනය (ජිජැක් 1994: 160-161) මත මනුෂ්‍ය සම්බන්ධතා (විශේෂයෙන් ගැහැණු-පිරිමි) අර්ථකතනය කළ විට පිරිමියා තම මිත්‍රත්වය ගැහැණියට වඩා උතුම් කොට සැලකීම උත්කෘෂ්ඨ වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කර ගත හැකිය. ඒ සඳහා 'ගැහැණු' හා 'පිරිමි' ලිංගික වෙනස පාදක කර ගත් දීර්ඝ සාහිත්‍යයක් ජිජැක් විසින් ලැකාන්, කාන්ට් හා හේගල් උපුටා දක්වමින් ගෙන එයි. (1994 153-159) එහිදී පිරිමියා ෆැල්ලසයේ ක්‍රියාව බෙදීමකට ලක් කරයි. එකක් 'ලිංගික විනෝදය, ලිංගික සහකරු සමඟ ඇති සම්බන්ධතාව' හා අනෙක නම් ෆැල්ලසය නොවන (non-phallic) සදාචාරමය අරමුණු හා අනන්‍ය වන ලිංගික - නොවන සාමාජීය ක්‍රියාව (public activity) හා අනන්‍යවීමයි. කැසබලන්කා චිත්‍රපටය තුළ සාමාජීය අධ්‍යයනයට බඳුන් විය යුත්තේ මෙම ප්‍රපංචයන් වන බව මෙහි දී සඳහන් කළ යුතු ය.

ඒ අර්ථයෙන් චිත්‍රපටයේ සෞන්දර්යමය හා තාක්ෂණික ලක්ෂණයන් මෙන් ම ජිජැක් දක්වන ඉතාම වැදගත් මනෝ විශ්ලේෂී තත්වයන්වලට පවා ඔබ්බෙන් පිහිටා ඇති මිනිසා මෙහෙයවන සංකේතීය තත්වයන් හා ඔහුගේ පුද්ගලිකත්වය හා සතුට ඉක්ම වූ ආචාරධර්මික ක්‍රියාවේ විශ්වීය කාර්යභාරය සඳහා පිටුවහල් වන්නා වූ වඩා දෘශ්‍යමාන නොවන නූතන මිනිස් ශිෂ්ටාචාරයේ සංකේතීය ගොඩනැංවීම් වල අද්විතීය කාර්යයක් කළ එමැනුවෙල් කාන්ට් ආශ්‍රය කර ගනිමින් චිත්‍රපටය හැදෑරීමට ලක් කිරීම විශ්වීය මිනිස් වටිනාකමේ මිලාන වී යන මෙවන් මොහොතක වඩා වැදගත් වේ.

පර්යේෂණ අරමුණු

නූතන මිනිස් ශිෂ්ටාචාරය තුළ මිනිසාගේ චින්තනය හා ක්‍රියාව නිගමනය කරන්නා වූ විශ්වීය ආචාර ධාර්මික වටිනාකම් (universal ethical values) කෙසේ ක්‍රියාත්මක වන්නේ ද යන්න කැසබලන්කා චිත්‍රපටය ආශ්‍රිත ව සාකච්ඡා කිරීම,

මිනිස් ආදරය තුළ අත්හැරීම යන්නම ආදරයේ උත්කෘෂ්ඨ මොහොතක් (sublime moment) ලෙස අර්ථකතනය කිරීමට චිත්‍රපටයේ ඇතැම් සිද්ධීන් හා චරිත උදාහරණ ලෙස භාවිත කිරීම,

එමැනුවෙල් කාන්ට් වැනි දාර්ශනිකයෙකුගේ ඉගැන්වීම් තවදුරටත් මිනිස් ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීමෙහි ලා කෙතරම් ප්‍රයෝජනවත් හා වලංගු වන්නේ ද යන්න යෝජනා කිරීම,

ජනප්‍රිය සිනමා කෘතියක් ලෙස කැසබලන්කා චිත්‍රපටයේ වැදගත්කමත් එය පිළිබඳ ව කිසියම් වෙනස් ව්‍යුහමය කියවීමක් කිරීමේ ශක්‍යතාව සොයා බැලීම, මෙම පර්යේෂණයේ අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමවේදය

චිත්‍රපටයේ අන්තර්ගතය එහි අර්ථයන් වඩාත් න්‍යායික ව තේරුම් ගැනීමේ දී සමකාලීන දාර්ශනික හා මතවාදී ප්‍රවණතා දෘෂ්ටිමය තලයක මෙන් ම විශ්ලේෂණීය තලයක මෙහි දී අදාළ කර ගනු ලැබේ. කාන්ටියානු සදාචාරය දර්ශනය පිළිබඳ යර්ගන් හබමාස්ගේ දාර්ශනික ප්‍රවණතා හා මාක්ස්වාදී දාර්ශනික ගොඩනැංවීම් මෙන් ම ව්‍යුහවාදී හා මනෝ විශ්ලේෂණයේ එන ඇතැම් අදහස් මෙම පත්‍රිකාවේ අරමුණ හා සාපේක්ෂ ව අර්ථකථනය හා විශ්ලේෂණය සඳහා භාවිත කෙරේ.

සාකච්ඡාව

චිත්‍රපට සාරාංශය

ජර්මානු නාසි පාලනයේ ඇති යුරෝපයේ සිට මධ්‍යස්ථ පෘතුගාලයටත් ඉන් පසුව අමෙරිකාවටත් පලායන මිනිසුන් සඳහා හමුවන තාවකාලික නවාතැන් පොළකි මොරොක්කෝවේ පිහිටි කැසබ්ලන්කාව. පෘතුගාලයට යෑමට වීසා නැතිවීම හේතුවෙන් දහස් ගණනක් සරණාගතයින් කැසබ්ලන්කාහි සිරවී ඇති හෙයින් හා දිනෙන් දින ඉහළ යන සරණාගතයන්හට වීසා ලබාදීම හරහා දැවැන්ත ලෙස කළු කඩ මුදල් සොයා ගැනීමට මෙය හොඳ තිප්පලක් බවට පත් වී ඇති අතරතුරේ ප්‍රංශ ජනාධිපති චාල්ස් ඩි ගෝල් විසින් අත්සන් කරනු ලැබූ 'සංක්‍රාන්ති වීසා' (Letter of Transit) දෙකක් ජර්මානු පණිවුඩකරුවන් දෙදෙනෙක් කෙරෙන් බලහත්කාරයෙන් ලබා ගැනීමෙන් පසු එම ලේඛන පදනම් කර ගෙන කැසබ්ලන්කා චිත්‍රපටය දිග හැරෙයි.

උගාටි විසින් අත්පත් කර ගත් මෙම ලියවිලි අවසානයේ කැසබ්ලන්කාහි ජනප්‍රිය 'රික්ස් කැෆේ අමෙරිකානා' නම් අවන්හල පවත්වාගෙන යන පැරණි විමුක්ති සටන් ඉතිහාසයක් ඇති හා මේ වන විට සංශයවාදී නුරුස්සන්නකු (cynic) වන රික් බ්ලේන් අතට පත්වේ. උක්ත සිද්ධිය පාදක කර ගනිමින් පොලීසිය විසින් අල්ලා ගත් පසුව අත් අඩංගුවේ දී මියයන අතර මෙම ලියවිලි පිළිබඳ ව හෝඩුවාවක් සහිත ව වික්ටර් ලැස්ලෝ යන චෙකොස්ලෝවැකියානු විමුක්ති නායකයා හා ඔහුගේ සුරූපී බිරිඳ එල්සා ලුන්ඩ් අවන්හලට පැමිණේ. මේ පැමිණීම හරහා රික් හා එල්සා අතර මෙතෙක් යටපත් ව තිබූ පැරණි ප්‍රබල ආදරයක් නැවත ඉස්මතු වීමට කරුණු යෙදේ. ලැස්ලෝ උත්සාහ කරන්නේ ද මෙම සංක්‍රාන්ති වීසා ආධාරයෙන් කැසබ්ලන්කාහි සිට ලිස්බන් කරා පැනගොස් තම සටන තව තවත් තීව්‍ර කිරීමට යි. ඒ සඳහා රික්ගේ සටන් ඉතිහාසය තුළු ගැන්වීමට ලැස්ලෝ කටයුතු කරණු ලැබුවා වුව ද එය රික් එම වීසා පත් ලබා දීමට ඒත්තු ගැන්වීමට තරම් ප්‍රබල නොවීය.

අවසානයේ එල්සා රික්ට තර්ජනය කර එම ලියවිලි ඉල්ලුව ද රික් එකඟ නොවන නමුත් එල්සා පැරණි ආදරය තුළ අසරණ ව ඇය රික්ව පැරිසියේ දී හැරදමා යෑමට මුල් වූ කරුණු ඉදිරිපත් කිරීමත් සමඟ රික් නැවත ඇයට බැඳෙන අතර එල්සා තවදුරටත් තමාට රික්ව හැරදමා ජීවත් විය නොහැකි බව කියයි. කෙසේ වුව ද ඔවුන්ගේ ආදරය නැවතත් ඉස්මතු වන අතර එල්සා නැවත රික් සමඟ වාසය කිරීමට සිත එකඟකර ගනී.

නමුත් සියල්ල නිවැරදි ව සංවිධානය කරන රික් අවසානයේ දී ලිපි ලැස්ලෝ හට ලබා දී එල්සා මෙ මොහොතේ ලැස්ලෝට අත්‍යාවශ්‍ය බව පවසන රික් තම ආදරය පරිත්‍යාග කරමින් ඔවුන් දෙදෙනාට සුභ පතයි. ඔවුන් ව හඹා පැමිණි නාසි යුධ නිලධාරියා රික්ගේ වෙඩි පහරින් මියයන අතර ඒ සඳහා රික්ගේ මිත්‍ර පොලිස් ප්‍රධානී රේනෝ රික්ව මිනී මැරුම් වගකීමෙන් නිදහස් වන ලෙස කටයුතු කරයි. සියල්ලට අනතුරු ව ඔවුන් වඩා යහපත් මිත්‍රත්වයක් සඳහා සපථ කරමින් පියමනින බොඳවී යන කැමරා කෝණය චිත්‍රපට ඉතිහාසය තුළ අනුස්මරණීය රූප රාමුවක් ජනිත කරයි.

යහපත, වගකීම හා කාන්ටියානු දර්ශනයඃ කාන්ට්

18 වන සියවසේ විශිෂ්ට ම දාර්ශනිකයා වූ එමැනුවෙල් කාන්ට් මිනිස් අචාර ධාර්මික චින්තනය සම්බන්ධයෙන් ඉතා ම වැදගත් බලපෑමක් කළ දාර්ශනිකයෙක් ලෙස ප්‍රකට ය. ඔහුගේ සදාචාර චින්තනය පුනරුදය තුළ බිහි වූ විශිෂ්ට ම දාර්ශනික නිෂ්පාදනයක් වේ.

අචාරධර්මීය ක්‍රියාව (ethical act), කාන්ටියානු අර්ථයෙන් හඳුන්වන්නේ හොඳ නරක, යහපත අයහපත හා හරි වැරැද්ද පිළිබඳ වන මිනිසාගේ විශ්වාසය හා එම විශ්වාසය සමඟ අනුගත වූ ක්‍රියාව (නැතහොත් එම විශ්වාසය මඟින් මෙහෙයවනු ලැබූ ද්‍රව්‍යමය ක්‍රියාව) අතර සම්බන්ධයට යි. නූතන මිනිසාගේ සමාජීය හා ආත්මීය ක්‍රියාකාරීත්වය කෙරෙහි අතිශයින් ම වැදගත් හෙළිදරව් කිරීමක් කළ දාර්ශනිකයෙකු ලෙස ජර්මානු ජාතික එම්මානුවෙල් කාන්ට් (1724-1804) අප හඳුනා ගන්නේ ඔහු විසින් ආචාර ධර්මීය ක්‍රියාව 'යුතුකම' (duty) සමඟ අනන්‍ය කළ නිසයි. වෙනත් අයුරකින් සඳහන් කළොත් මිනිසාගේ ප්‍රායෝගික ව කුමක් කළ යුතු ද යන්න සඳහා 'හේතුව' යන්න සම්බන්ධ කළ දාර්ශනිකයා කාන්ට් ය. 'යුතුකම මඟින් ක්‍රියාත්මකභාවය' (acting from duty) නිර්වචනය කරන කාන්ට්(1964: 26) යුතුකම නම් යහපත් චේතනාව, යම් යම් විෂය මූලික සීමාකම් හා බාධාවන් තුළ සැඟවී යනවා හෝ හඳුනා ගැනීමට නොහැකිවනවා වෙනුවට, වෙනස විසින් (අයහපතට සාපේක්ෂ) එය වඩාත් දීප්තිමත් ව බැබළෙමින් මතුපිටට ළඟාවනු ඇති බව සඳහන් කරයි. ක්‍රියාව කිරීම සම්බන්ධයෙන් අපගේ ප්‍රේරණය කුමක් වුවත්, යුතුකම විසින් ඉල්ලා සිටින්නා වූ ක්‍රියාව හා යුතුකම හා සමපාත වේ නම්, එම ක්‍රියාව යුතුකම හා එකඟ වේ'. සැබෑ අචාරධාර්මික වටිනාකමක් ඇත්තේ එවැනි ක්‍රියාවන් සඳහා පමණක් බව පවසන කාන්ට් අචාර ධාර්මික වටිනාකම' යනු අචාර ධාර්මික අනුමත කිරීම් ඉක්මවා යන ගෞරවය වෙනුවෙන් පොදු සබුද්ධික අචාරවාදී ඥානය (cognition) හරහා කරන ක්‍රියාවන් ද ඉක්මවා යන, යහපත් චේතනාව මත පමණක් පදනම් ව කරන කොන්දේසි විරහිත ක්‍රියාවන් වේ." (වුඩ් 1999: 27). මේ අනුව කාන්ට්ගේ අචාරවාදී යහපත යම් නිරපේක්ෂ අගයක් ගනු ලබනවා පමණක් නොව අප ගෞරවය ලාභ ප්‍රයෝජන තකා ප්‍රයෝජ්‍යතා පදනමකින් (utilitarian) කරන ක්‍රියාවන් වටිනාකමක් සහිත ක්‍රියා ලෙස සැලකෙන්නේ නැත. "එමෙන් ම අන්‍යයන්ගෙන් අවලාද ඇසීමට වලක්වා ගැනීමට කරන ක්‍රියා වටිනා ක්‍රියා ලෙස සැලකෙන්නේ ද නැත." (1999:27). මෙයට උදාහරණයක් සපයන කාන්ට් කඩහිමියෙක් තම ගණුදෙනුකරුවන් සමඟ සාධාරණ වෙළඳාමක් පවත්වා ගෙන යන්නේ (ඔහුගේ වගකීම) ලාභය

සඳහා නොව තමාට එන අපකීර්තියෙන් බේරීම සඳහා වූ ආසන්න ම ආනුභූතික පාරිතෝෂිකයෙන් (empirical incentives) අනුබල ලැබීම නම් ප්‍රතික්‍රියාවෙන් පොළඹවනු ලැබීමෙන් නම් එවැනි ක්‍රියා වගකීම විසින් ම මෙහෙයවනු ලැබූ ක්‍රියාවක් ලෙස කාන්ට් නිර්වචනය කරන්නේ නැත.

අචාරධාර්මික ක්‍රියාවේ ප්‍රේරණ (motive) විය යුත්තේ අප වටිනා යැයි තක්සේරු නොකරන ක්‍රියාවක් එහි ප්‍රතිඵලයෙහි යහපත දෙස බලා අකමැත්තෙන් වුවත් කිරීමට සහභාගී වීම නොව ක්‍රියාව තුළ නෛසර්ගික ව ඇති අචාරධාර්මික යහපත අවබෝධ කර ගනිමින් එම අවබෝධය විසින් ක්‍රියාව ක්‍රියාව සඳහා ම අප ව මෙහෙයවනු ලැබීමට ඉඩ හැරීම ය. ස්වාභාවික ව මිනිසා තුළ ඇති ස්වාභාවික ආශාවට ඉඩ හැරීම වෙනුවට සබුද්ධිකත්වය තුළ වඩා නිවැරදි දෙය කිරීමට අප ව අප විසින් ම ස්ථානගත කර ගැනීම ය. ස්වාභාවික ආශාව තෘප්තිමත් කිරීම සඳහා වන ප්‍රේරණය තෘප්ත මූලධර්මය (pleasure principle) එහි පිරිසිදු ම ෆොයිඩියානු මනෝ විශ්ලේෂණය තුළ හැඳින්වෙන්නේ 'මරණ ආශයක් යනුවෙනි' (ජිජැක් 2003: 211-222). මෙහිදී මිනිසා ආචාර ධාර්මික අන්තර්ගතය තුළ ශිෂ්ට කළ යුතු යථාර්ථ මූලධර්මය (reality priciple) මැදිහත් වී මිනිසාගේ ස්වාභාවික තෘප්ත ආශ්‍රය වඩ වඩාත් පිරිපහදු කරමින් ඔහු ශිෂ්ට ජීවියෙක් බවට පත් කළ යුතු වේ. මේ අනුව මිනිසා තම ආත්මීය මමංකාරය හා ආශාව තෘප්ත කිරීමට ඇති ස්වාභාවික ප්‍රේරණය නම් මිනිස් ස්වභාවය (human nature) විසින් ආචාර ධාර්මික හේතුව (moral reason) තුළ ක්‍රියාව හැසිරවීමට ප්‍රතිරෝධයක් මිනිසාට දැක්විය හැකි වුවත් අන් කිසිම ප්‍රයෝජනයක් හෝ ප්‍රතිඵලදායකත්වයක් (consequalitializm) නොබලා වගකීමේ ක්‍රියාව හා එය වෙනුවෙන් ම තම ක්‍රියාව හැසිරවිය යුතු වේ. මෙය විශ්වයේ සියලු සබුද්ධික ජීවීන්ට අදාළ කර ගත හැකි 'ප්‍රායෝගික නීතියක්' (කාන්ට් 1964: 29) බවට පත්කර ගැනීම කාන්ටියානු විශ්වීය නිතියයි (Kantian Universal Law).

> "මෙම කාන්ටියානු සබුද්ධික ආචාර ධාර්මික මිනිසා හා විශ්වීය ආචාරවාදී නීතියම පිළිබඳ දැනුවත්භාවය (මෙම දැනුවත් කැමැත්ත යනු නිදහසයි) විසින් මිනිසා නිදහස කරා යොමු කරවයි" (වුඩ් 1991: 171).

නිදහස ප්ලේටෝනියානු ගුප්ත ඒජන්තයා ලෙස

මිනිස් සමාජය ස්වයංක්‍රීය ව වඩා යහපත දෙසට ගමන් නො කරයි. මිනිසා නිදහස හා විමුක්තිය කරා මෙහෙයවනු ලැබුවේ නූතනත්වය තුළ උසස් දේශපාලන ව්‍යාපාර විසිනි. ඒ සඳහා මිනිසුන් ඒකරාශී වන්නේ යම් යම් ක්‍රියාවන් හා අර්ථයන් සඳහා පොදුවේ පිළිගනු ලැබූ වටිනාකම් සම්පාදනය කිරීම මගිනි. එම වටිනාකම් භෞතික කර ගැනීම පිණිස මිනිස්සු ඒකරාශී වෙති. එම වටිනාකම් වෙනුවෙන් පෙනී සිටින හා කැප කිරීම් කරන්නවුන් යම් දේශපාලන ක්‍රියාවක නායකයින් වන අතර ඔවුහු මිනිසුන් මෙහෙයවති. එම මෙහෙයවීම පෙරළා මිනිස්සු පිළිගනිති. ඇතැම් විට එවැනි නායකත්වයක් රහිත ව වුව ද වටිනාකම් විසින් මිනිසුන් මෙහෙයවනු ලබයි. එනම් ක්‍රියාවේ අර්ථය ම පොදුවේ බෙදාහදා ගනිමින් ක්‍රියාවේ අවසානය සඳහා මිනිසුන් ඒකරාශී වේ. කැසබලන්කා චිත්‍රපටය ඉතා ම වැදගත් වන්නේ එහි මිනිසුන් මෙහෙයවනු ලබන ස්වාමි හැඟවුම සැඟව නැත්නම් ගුප්ත ආකාරයකින් පැවතීමයි. මෙතන දී ස්වාමි හැඟවුම

යනුවෙන් අදහස් කරන්නේ මිනිසුන් ඒකරාශී වීම සඳහා වූ කේවල පුද්ගල අභිලාෂයන් ඉක්මවා යන පොදු ගුණාකාරයකි. ස්ලෙවෝයි ජිජැක් මෙය, අර්ථකතනය කරන්නේ 'සංකේතීය බලයේ හිස් හැඟවුම' (ජිජැක් 2008: 239) ලෙසිනි. "'විප්ලවය', 'ජාතිය' යන නම්වලින් හැඳින්වෙන යම් සමාජයක ක්‍රියාත්මකවීමේ ඒකග්‍රතාව ය රඳවා තබා ගැනීමේ මහා අනෙකාගේ සහතික වීම මෙම හිස් හැඟවුම විසින් කරනු ලබයි. මෙයින් අර්ථවත් වන්නේ කුමක් දැයි කිසිවෙක් නොදන්නා නමුත් අනෙක් අය මෙය දන්නවා ඇතැයි යන පූර්ව උපන්‍යාසය මත සිට ක්‍රියාත්මක වීම මෙහි ඇති තර්කණය යි" (2008: 304-305). ඒකාධිකාරී බල ව්‍යුහයක් අර්ථකතනය කර ගැනීම සඳහා ජිජැක් භාවිත කරන මෙම ලැකානියානු මනෝ විශ්ලේෂණ න්‍යායික සන්දර්භය අප මානව නිදහස උදෙසා අපව යටත්කරණය කරන්නා වූ ප්‍රජාතන්ත්‍ර විරෝධී, නාසිවාදී ඒකාධිපතිත්වයකින් මිදීමට සමාජයක් ලෙස ඒකාරාශී වන්නේ හා ඒ සඳහා සහභාගීවන්නේ කුමන ආකාරයකින් ද යන්න කැසබ්ලන්කා චිත්‍රපටයේ සිදුවීම් හා චරිත ඔස්සේ මෙතැන් සිට විග්‍රහ කෙරේ.

චිත්‍රපටය සන්දර්භගත වන්නේ නාසි ජර්මනියේ භූගෝලීය ව්‍යාප්තවාදයත් සමඟ නාසි වධබන්ධනවලට බියෙන් ආරක්ෂිත භූමියක් සොයා පලායන මිනිසුන් එක්රැස් වෙන අප්‍රිකාවේ එක් තීරණාත්මක භූමිභාගයක් වන මොරොක්කෝවේ කැසබ්ලන්කා නම් නගරය පසුබිම් කර ගෙන ය. එක් භූමියක සිට තවත් භූමියක් කරා යනතෙක් තාවකාලික ව ලැගුම්ගෙන සිටින සංක්‍රමණීය සංක්‍රාන්ති බිමක් (transitory territory) ලෙස මෙහි සිදුවන සිදුවීම් හා චරිතවල ක්‍රියාකාරිත්වය මන්දගාමී ලෙස පෙනුනත් ඉතාම වේගවත් ලෙස මෙන් ම ඉතා ම අවිනිශ්චිත බවකින් යුක්ත ව එම සිද්ධි චිත්‍රපටකරු අප වෙත ගෙන එයි. ඒ සඳහා මයිකල් කර්ටිස් නම් සිනමාකරු ඉතාම විශිෂ්ට කලාත්මක තාක්ෂණයක් ද භාවිත කරයි. මෙහි එන ඇතැම් දූරස්ත හා සමීප කැමරා මානයන් මෙතෙක් ලොව බිහි වී ඇති සුවිශිෂ්ටම උදාහරණ අතර අංක එකට අවිවාදිත ව නම් කර ඇති බවට ඇතැම් බටහිර විචාරකයන් සඳහන් කරන්නේ ද (Robertson 1993: 23) එබැවිනි. අනෙක් අතට කැසබ්ලන්කා නම් ශිෂ්ට සමාජයෙන් දූරස්ත, අපිළිවෙළ හා යුද්ධය නිසා ඇති වූ හැල හැප්පීම්වලින් පිරි හුදකලා භූමි භාගය කිසියම් වි-ප්‍රදේශගතකරණයක් ඇති කරයි. එවන් ශිෂ්ටත්වය හා ආචාරධර්මීය නීතිය නොවලංගු වූ ස්ථානයක ඇතිවන නීතිය, පිළිවෙළ, ශිෂ්ටත්වය හා යහපත අරමුණු කරගත් ස්වාමි හැඟවුම ඉතා විශාල මෙහෙයක් මිනිස් අවිඥානය තුළ කරන බවට එම දූරස්තකරණයට තාක්ෂණික ලෙස චිත්‍රපටය තුළ සාක්ෂි දරයි. දැවැන්ත මානව අර්බුදයක් සිනමාවට නගන කර්ටිස්ගේ මෙම සිනමාපටය ඔස්සේ අමරිකානු රිදී තිරයේ මතු නොව අමරිකානු සංස්කෘතියේ මුද්‍රා යනුවෙන් (icons) නම් කර ඇති හම්ප්රි බෝගාට් හා ඉන්ග්‍රිඩ් බර්ග්මාන් යන නළු නිළි දෙපල ද තීරණාත්මක ලෙස ගෝලීය ව ඉස්මතු වන්නේ මෙම විශිෂ්ට සම්භාව්‍ය චිත්‍රපටය පාදක කර ගනිමිනි. අද දිනටත් අමරිකානු චිත්‍රපට ආයතනයේ (American Film Institute = AFI) වර්ගීකරණය අතර අංක 2 යන ස්ථානය ඉතා විශාල කාලයක් මෙම චිත්‍රපටය නියෝජනය කර ඇත්තේ එහි චිත්‍රණය කර ඇති මානව අරගලය, පුද්ගල ආදරය හා මහේෂ්ක දේශපාලනය අතර දෝලනය, මිනිස් වටිනාකම් හා වගකීම පිළිබඳ සම්භාව්‍ය අර්ථකතනය මෙන් ම නිර්ලෝභී ව කිව යුතු අතිවිශිෂ්ට රංගනය හේතුවෙනි.

නාසීන් විසින් ප්‍රංශය ආක්‍රමණය කළාට පසුව ප්‍රංශ යටත් විජිතයක් ලෙස පවතින මොරොක්කෝවේ බලය ද නාසීන් අතට පත්වේ. ඒ අනුව කැසබ්ලන්කාව තුළ නාසි යුධ නීතිය ද එමෙන් ම ප්‍රංශයේ සිවිල් නෛතික ක්‍රියාත්මකභාවය ද එකවිට ම ජර්මානු-ප්‍රංශ එකඟතා ගිවිසුම් යටතේ බල පැවැත්වේ. නාසීන්ගේ යටත්කරණයට විරුද්ධව බිම්ගත ව (underground) සංවිධානය වූ දැවැන්ත විමුක්ති ව්‍යාපාරයක නායකයෙක් වන චෙකොසලෝවැකියානු ජාතික වික්ටර් ලැස්ලෝ තම සුරූපී බිරිඳ ද සමඟ කැසබ්ලන්කාවට ළඟාවන්නේ මේ අවස්ථාවේ ය. ඔවුන්ගේ අභිප්‍රාය තම සටනේ ඊළඟ පියවර ලෙස ඇමරිකාවට යාම ය. මේ සඳහා මීට දින කිහිපයකට පෙර ජර්මානු නාසීන්ගෙන් බලහත්කාරයෙන් පැහැර ගන්නා ලද ප්‍රංශයේ බලාත්මක කරන ලද සංක්‍රාන්ති වීසා පත් දෙකක් (transit visa) උපයෝගී කර ගැනීම ඔවුන්ගේ සැලැස්මයි. මේ අතරවාදයේ දී ඔවුන්ට රික් අමරිකානා (Rick Americana) සමාජ ශාලාව පවත්වාගෙන යන රික් ව මුණ ගැසේ. ඔවුන්ගේ සටන්කාමී හා ආදරණීය අතීතය හා වර්තමාන සම්බන්ධතා දේශපාලණික අඩංගුව මෙන් ම තමාට ආවේණික අයුරකින් මානව විරෝධී නාසි පාලනයට එරෙහි ව සටන් වැදීම නම් එතරම් මතුපිටට නොපෙනෙන ක්‍රියාව (mysterious act) තුළ ඇති කාන්ටියානු වගකීම හා යුතුකමේ ආචාරධාර්මික විශ්වීය ක්‍රියාත්මකභාවය විශිෂ්ට අයුරකින් දැකගත හැකි වීම මෙම චිත්‍රපටය සාකච්ඡාවට බඳුන් කළ යුතු ඉතා වැදගත් ප්‍රපංචයීය තත්වයක් ලෙස සඳහන් කළ හැකි ය.

එක් අතකින් මෙහිදී වගකීමේ ආචාරධාර්මික ක්‍රියාව (ethical act) යම්තාක් දුරකට සැඟව පවතින්නේ විශාල අධිකාරක බලයක් සහිත අමානුෂික නාසිවාදය ඉදිරියේ විවෘත ව කටයුතු කිරීමට ඇති භෞතික නො හැකියාව විසිනි. එනමුදු කේවල පුද්ගලත්වයන් විසින් කරන විමුක්ති ක්‍රියාව ඇත්ත වශයෙන් යම් පුද්ගල නායකත්වයක් (subjective body) විසින් මෙහෙයවනු ලබන්නේ හා ඒ හරහා ඒකරාශී කරන්නේ නැත. නැතහොත් පුද්ගලයින් සතු පොදු ආශාව පුද්ගල ශරීරයක මැදිහත්වීම විසින් ද්‍රව්‍යමය ලෙස සංවිධානය කර නිශ්චිත අරමුණු කරා මෙහෙයවන ඍජු හෝ වක්‍ර ඒජන්තයෙක් නැත. මෙහිදී වික්ටර් ලැස්ලෝ සංකේතීය තලයක ක්‍රියාත්මක වුවත් ඔහුගේ නායකත්වය හා නිර්භීත බව විසින් ස්වාමි හැඟවුමක් ජනිත කළත් මෙම කැසබ්ලන්කා නම් භූමිය තුළ ඔහු පුද්ගලයින් සංවිධානය කරමින් විමුක්ති අරමුණු කරා මෙහෙය වන්නේ නැත. එසේ වුවත් අව-මානුෂික නාසිවාදය පරාජය කර මානව නිදහස සාක්ෂාත් කිරීම නම් විශ්වීය හැඟවුම හා මෙම චිත්‍රපටයේ සියලු චරිත (නාසීන් හැර) විසින් අනන්‍ය වෙමින් තමාට ආවේණික දුරකින් එම හැඟවුම වෙනුවෙන් සටන් කරනු මෙහිදී ඉතා පැහැදිලිව දැක ගත හැකි ය. අනෙක් අතට එම සැඟවී ඇති ගුප්ත හැඟවුම යම් රහස්‍ය ස්වභාවයක් දරා සිටී. එනම් එය කිසි විටක තමා හෙළි නොකරන ඇගල්මාවකි. උදාහරණයක් ලෙස රික් තමාගේ සටන්කරුවන් ලෙස වන පැරණි ඉතිහාසය මෙන් ම අද දවසේ ද වික්ටර් ලැස්ලෝවන් අය විසින් මූලිකත්වය ගෙන ඇති නාසි විරෝධී විමුක්ති සටන සඳහා වන අවිඥානික කැමැත්ත හා එම සටනේ ජයග්‍රහණය ප්‍රර්ථනා කිරීම අවම වශයෙන් තම සමීප මිතුරන්ටවත් හෙළි කරන්නේ නැත. අවම වශයෙන් රික් තමාගේ අවන්හලේ දී මේජර් ස්ට්‍රසර් විසින් ජර්මානු ජාතික ගීය ගයන විට දී පවා ඒ වෙනුවට ප්‍රංශ ජාතික ගීය ගැයීමට මිනිසුන් පොළඹවන ලද්දේ

ලැස්ලෝ විසින් වන අතර රික් එම සිදුවන දෙය සම්බන්ධයෙන් විවෘත ලෙස කිසිදු විටක මැදිහත් වන්නේ නැත. මෙම විවෘත නොවන ගුප්ත බව පිටුපස රික් බ්ලේන් ද ඇතුළු බොහෝ දෙනෙකු තුළ 'නිවැරදි දේ කුමක් ද, නිදහස යනු කුමක් ද?' මෙන් ම 'තමා පුද්ගලයකු ලෙස මහේෂික සටනේ ජයග්‍රහණය අරඹයා කුමක් කළ යුතු ද' යන්න පිළිබඳ ව ඉතා හොඳින් දැනුවත් ය. චිත්‍රපටය තුළ දැකිය හැකි ඉතා ම වැදගත් කරුණ වන්නේ එම පුද්ගල ශරීර විසින් ඉතා ම තීරණාත්මක මොහොතක දී ක්‍රියාකරන්නේ කෙසේ ද යන කරුණ මිස ඔවුන් තම අනන්‍යතාව ඍජුව හෙළි කරනවා ද නැද්ද යන කරුණ නොවේ. මිනිසුන් නිශ්චිත මොහොතක දී කාන්ටියානු අර්ථයෙන් වගකීමේ ක්‍රියාව තුළට ප්‍රවිශ්ට වනවා ද නැද්ද යන කරුණ නූතන අර්ථයකින් ඉතාම වැදගත් දේශපාලන නිමේෂයක් වන අතර ඔවුන් විවිධාකාර වූ තලවල විවිධ මිනිසුන් සමඟ විවිධ දෘෂ්ටිවාදයන් සමඟ ගණුදෙනු කිරීම (ඍජු අනන්‍යතාවක් අරගලයක දී ඒකරාශිවීම තුළ ඉතා ම වැදගත් වනවා වුවත්) යන කරුණු ගැන අප තේරුම්ගත යුත්තේ පැවැත්මේ සන්දර්භගත සාධක ලෙස මිස මිනිසාගේ සැබෑ දේශපාලන අභිලාෂයන්ගේ පරාවර්තනයක් ලෙස නොවේ. මේ කරුණ මත පදනම්ව අවසන් මොහොතේ දේශපාලනික වනවා යැයි කියමින් පැවැත්ම තකා ඕනෑම පසුගාමීත්වයක්, ජනතා විරෝධී ක්‍රියාවක් හෝ ප්‍රතිවිප්ලවකාරීත්වක් හෝ පවාදීමක් කරා මිනිසුන් යොමු වීම සාධාරණීකරණය කිරීම කෙසේවත් කළ නොහැකි බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. මා කියා සිටින්නේ සමාජීය නිමේෂයන්හි දී ඍජුව අනන්‍යතාවන් හෙළි කිරීම හෝ නොකිරීම මත මිනිසාගේ සැබෑ දේශපාලනික භාවිතය මගින්, අචාරධාර්මික ක්‍රියාව මැන බැලීම සඳහා එක එල්ලේ පාවිච්චි කිරීම දේශපාලනික වරදක් විය හැකි බවයි. මන්ද චිත්‍රපටය තුළ රික්ගේ භාවිතය පිළිබඳ ව එල්ල වී ඇති නිර්-දේශපාලනිකත්වය, නාස්තිකවාදී සංශය හා පුද්ගල අභිලාෂයන් හා ආශාවන් හඹා යෑම පිළිබඳ විවේචනයත් හා ඔහුගේ ව්‍යාපාරික 'මානසිකත්වය' පිළිබඳ බැලූ බැල්මට පෙනෙන යථාර්ථයට පසුව තීරණාත්මක මොහොතක මතු වන ආචාරධාර්මික විශ්වීය වගකීම අහං-පරමාදර්ශී (ego-ideal) නිදහස පිළිබඳ හැඟවුම හා අනන්‍යවීම රික් සාමාන්‍ය හැගීම්බර ප්‍රේමවන්තයෙක් නම් ස්ථානයෙන් පරිණත ආචාරධාර්මික පිරිමියෙක් දෙසට ඔසවා තබයි.

බොහෝ විට දේශපාලනික මෙන් ම ප්‍රායෝගික ජීවිතයේ මිනිසුන්ගේ ක්‍රියාත්මක මැදිහත්වීම දෙස බලා සරල ව දේශපාලනික හෝ නිර්-දේශපාලනික (රැඩිකල් හා පසුගාමී, ප්‍රගතශීලී හා ප්‍රතිගාමී, ක්‍රියාකාරීන් හා නිෂ්ක්‍රීය මිනිසුන් යන දෙගොඩ ගැසීම) ලෙස බෙදීම ලාංකික සන්දර්භයක දී ඉතා පොදුවේ දක්නට ලැබෙන තත්වයකි. මෙම බෙදුම්කඩනය වෙනුවට කැසබලන්කා චිත්‍රපටය තුළ හැසිරෙන මිනිසුන්ගේ ක්‍රියාත්මකභාවයේ සංකීර්ණත්වය සැලකිල්ලට ලක් කරමින් ලාංකික රෝමාන්තික රැඩිකල් බව තේරුම් ගැනීමට ආලෝකයක් සපයයි. පසුගිය දශක තුනක ඉතිහාසය තුළ සන්නද්ධ අරගල තුනකට පසු එම ඉතිහාසය අත්කර දුන් විනාශය අතිමහත් බවට උදාහරණ ලෙස අද දවසේ මිනිසුන්ගේ වික්ෂිප්ත බව හා ක්ෂිතිය බරපතල දේශපාලනික ගැටලුවක් ලෙස අප ඉදිරියේ අද ඉතිරිව ඇත. එම අරගලයන්ට බලපෑ ද්‍රව්‍යමය තත්වයන් තවදුරටත් ඒ ආකාරයෙන් ම පවතින බැවින් හා ඉතිහාසය නැවතත් පුනර්වාචී වීමට ඉඩ ඇති මේ මොහොතේ ඒ අර්ථයෙන් කැසබලන්කා චිත්‍රපටය තුළ ක්‍රියාත්මක වන සංකීර්ණ එහෙත් මතු

පිටට නොපෙනෙන දේශපාලනික ක්‍රියාත්මකභාවය හැදෑරීම ලාංකික සන්දර්භයක් තුළ වැදගත් වනු ඇත.

කැසබලන්කා චිත්‍රපටයේ නිදහස සඳහා වූ ගුප්ත හැඟවුම හා අනන්‍යවීමක් මගින් වඩා පරිණත අචාරධාර්මික මිනිසෙක් ලෙස ඉස්මතු වීමට රික්ට මෙන් ම අනෙක් චරිතවලට ද විවෘත ඉඩකඩක් සාන්දෘෂ්ටික අර්ථයකින් තම පුද්ගල තේරීම (personal choice) හරහා ගොඩනඟා ගැනීමට හැකිවීම ඉතා වැදගත් තේමාත්මක විකසිත වීමකි. මිනිසා යහපත් යනුවෙන් අභ්‍යන්තරීකරණය කරගෙන ඇති ප්‍රතිරූපය බවට පත්වීම වැදගත් කොට සැලකීම ව්‍යාපාරිකයෙක් හෝ ආදරවන්තයෙක් ලෙස හා තමා නොනැසී පැවතීම (survival=ප්‍රවර්තනය) වෙනුවෙන් පෞද්ගලික මමංකාරය තුළ ක්‍රියාත්මක වීම වෙනුවට සංකේතීය ව අසීරු කාර්යයක් රික් තෝරා ගනී. ඔහු නූතන සබුද්ධික අචාර ධාර්මික මිනිසෙක් ලෙස කාන්ටියානු අර්ථයකින් තම ජීවිතයේ පරිපූර්ණත්වයේ අර්ථය සම්පාදනය කර ගන්නා අතර බලා සිටින ප්‍රේක්ෂකයින් වෙනුවෙන් ඔවුන්ගේ ජීවන අර්ථයන් සම්පාදනය කර ගැනීම හා ඒ අනන්‍යවීම පිළිබඳව විශ්වීය ආදර්ශනයක් සපයයි. එවිට හොඳ නරක පිළිබඳ ඇගයුම් ඇත්ත වශයෙන් තමාට බාහිර සිදුවන්නේ ස්වයං-සමුද්දේශනයක් (self-referential) හරහා ය. නැතහොත් කාන්ටියානු පූර්වය (priori) උපයෝගී කර ගනිමිනි. එනම් "අපගේ ප්‍රයෝගික ක්‍රියාවේ අඩංගුව නම් වස්තුව හෙවත් අපගේ ක්‍රියාවේ රූපය (form) තුළ ඇති විශ්වීය ව්‍යවස්ථාව" (ජිජැක් 2002: 230) ආධාර කර ගනිමිනි. මෙය නූතන මිනිසුන් ලෙස අප නම් මේ වනවිටත් අභ්‍යන්තරීකරණය කර ගෙන ඇති තත්වයකි. අනෙක් අතට ලෝකය ලස්සන හා පිළිවෙළ තැනක් පිළිබඳ උතෝපියාව ආරම්භවන්නේ ප්ලේටෝගේ රිපබ්ලික් ග්‍රන්ථය සමඟ ය. පිළිවෙළක් හා විධිමත් භාවයක් සහිත නගරය නිර්මාණය කිරීම ප්ලෙටෝගේ පරමාර්ථය විය. මනුෂ්‍ය ශිෂ්ටාචාරය තුළ විධිමත්භාවය මුලින් ම පරිකල්පනය කළ දාර්ශනිකයා වූ ප්ලෙටෝගේ යුතෝපියාව මත පදනම් ව මෙම ස්වාමි හැඟවුමේ ගුප්ත ස්වභාවය නිර්වචනය කිරීම පිණිස ජිජැක් (2011) පාවිච්චි කරන්නේ "ප්ලැටෝනික ගුප්ත හැඟවුම" යන වචනයයි.

අතහැර දැමීම (අත්පත් කර නොගැනීම) ආදරය ලෙස

රික් තමාට පැරිසියේ දී හමු වූ සුන්දර ස්ත්‍රිය වන එල්සා සමඟ කිසිදා නොබිඳෙනා පෙරුම් පුරණ ආදරයක් (courtly love) ඔස්සේ සදාකාලික වූ ආත්මීය සම්බන්ධයක් ආරම්භ කළත් නිශ්චිත දේශපාලනික සමාජීය හා රෝමාන්තික කරුණු මත පදනම්ව එල්සා එම සම්බන්ධය එක් නිශ්චිත මොහොතක නවත්වාලන්නේ ඒ වනවිටත් තමා හා විවාහ වී සිටි විමුක්ති සටන්කාමියෙක් වන වික්ටර් ලැස්ලෝහට ඈ අතිශයින් ම අවශ්‍ය වන මොහොතක ඔහු තනි කිරීමට නොහැකි නිසා බව කියමිනි. නාසින් පැරිසිය ආක්‍රමණය කරන දින ම වෙන්වන ඔවුන් නැවත හමුවන්නේ කැසබලන්කාහි දී ය. පැරණි පෙම නො වැලැක්විය හැකි ලෙස නැවත ඉස්මතු වූ පසු තවදුරටත් සටන් කරනු නො හැකිව ඇය රික් වෙනුවෙන් කැසබලන්කා හි සිටීමට තීරණය කරයි. නමුත් නිදහස් අරගලයක නිරත වන ලැස්ලෝහට ඈ අත්‍යවශ්‍ය වන බව ඒත්තු ගන්නා රික්, දැනටමත් ලැසලෝගේ බිරිඳ වන එල්සා තමා සතු කර ගැනීමට අවශ්‍ය සියලු භෞතික හා මානසික පූර්ව

කොන්දේසි සපුරා තිබියදීත් තමා සතු වීසා බලපත්‍ර දෙක ඔවුන් දෙදෙනාට දී ඔවුන්ට රටින් පිටවීමට උදව් කරයි.

මෙහිදී රික්ගේ රෝමාන්තික හැඟිම්බර ආදරය පසුපසට ගොස් වගකීම විසින් මෙහෙයවනු ලැබූ මානව වර්ගයා ම කෙරෙහි ආදරයෙන් (philanthropic love) කරනු ලබන වඩා 'ප්‍රායෝගික ආදරයක්' (practical love) (කාන්ට් 1964: 401-402) ඉස්මත්තට පැමිණේ. මෙම මානව ආදරය හුදු ස්වාභාවික එකක් නොව 'හේතුව' විසින් මෙහෙයවනු ලබන ආචාරධාර්මික නැමියාවක් (moral predispotion) සහිත එකකි. මෙය නිර්-පාර්ශවීය ආදරයක් වන අතර වගකීම විසින් මෙහෙයවනු ලබන්නකි. කාන්ට් සඳහන් කරන්නේ,

> "අනෙකාගේ සන්තෘෂ්ටිය අත්පත් කර දීම අපගේ සමාජීය අවසනයෙහි යුතුකම වන බැවින් මානව ආදරය අනෙකා තුළ ද ස්ථාපනය කිරීම අපගේ වගකීමක් ද වන්නේ" (කාන්ට් 1964: 456) යනුවෙනි.

ඒ අනුව මෙම විශ්වීය මානව ආදරය යන්න අපගේ පුද්ගල අභිලාෂයන්ගෙන් මෙන් ම අප තුළ අපව සන්තෘෂ්ටියට පත් කර ගැනීමට ඇති සත්ව ආශාව පරාජය කරන්නකි. සන්තෘෂ්ටිය යනු අනෙකාගේ පූර්ණතාවේ නියෝජනයක් නැත්නම් අනෙකාගේ තෘප්තියේ නියෝජනයක් ලෙස ලබා ගත යුත්තකි. නමුත් එය මා තෘප්තිමත් වන්නේ අනෙකාගේ තෘප්තිය/පූර්ණත්වය හරහා වීම නොඑසේනම් අනෙකාට පූර්ණතාවට පත්වීමට මා උදව් කරන්නේ මා තෘප්තවන බැවින් වීම පිළිගත හැක්කක් නොවේ.. තෘප්තිය/සන්තෘෂ්ටිය යනු අනෙකාගේ තෘප්තියම පමණක් මිස එය මගේ සන්තෘෂ්ටියේ මාධ්‍යයක් නොවේ. මේ අනුව රික්ගේ කැප කිරීම ඔහුගේ පුද්ගල තෘප්තිය ඉක්මවා යන්නකි. රික් අවසානයේ සඳහන් කරන්නේ 'එල්සා මේ මොහොතේ ලැස්ලෝට අත්‍යවශ්‍ය' බවයි. මේ අත්‍යවශ්‍යතාව හුදු ශාරීරික අවශ්‍යතාවන් ඉක්මවා යන මානසික එකකි. මෙහිදී ඈ අත්‍යවශ්‍ය යැයි කියන්නේ ජිජැකියානු අර්ථයකින් පිරිමියා මහේෂ්ක තලයක වඩවඩා සාමාජීය වනවිට ඔහු ක්ෂුද්‍ර තලයක වඩවඩාත් ගැහැණිය හෝ සමාගම අපේක්ෂා කරයි' යන දයලෙක්තික අවිඥානික ගොඩ නැංවීම පාදක කර ගනිමිනි. අප වගකීම (යහපත) සඳහා කැපවන විට, එම 'යහපත'ට පිටුපසින් 'රැඩිකල් නපුරක් පවතී' (ජිජැක් 2008:24) යන දයලෙක්තිකය වඩාත් අදාළ වන්නේ මේ අවස්ථාවේ දී ය. පිරිමියා විසින් වඩාත් සමාජීය ක්‍රියා සඳහා තම භෞතික ශරීරය කැප කරන විට ඔහු අවිඥානික ව ගැහැණියගේ ලිංගිකත්වය මානසික ව දරා සිටී. සමාජීය ක්‍රියාවෙහි අවරෝධික අනෙක් යටිපෙල අර්ථය අශ්ලීල ලිංගික එකකි. සමාජයක් මෙන් ම පුද්ගලයෙක් සම්පූර්ණ ලෙස තේරුම් ගැනීමට මේ අර්ධ දෙකම අවශ්‍ය වේ. පැවැත්ම යනු මේ දෙකෙහි ඒකත්‍යයකි. කෙසේ වුව ද අනෙකාගේ තෘප්තියට අදාළ මේ දයලෙක්තික ක්‍රියාව ගැන සවිඥානික රික් එල්සාට ලැස්ලෝ සමඟ ලිස්බන් කරා පිටවීමට අවශ්‍ය පහසුකම් සපයයි. එසේ කිරීමට යැයි ඔහුට කිසිවෙක් විධාන නො කරන නමුත් ඔහුගේ විධායකයා වන්නේ යහපත පිළිබඳ කාන්ටියානු ස්වාමි හැඟවුමයි. එම පරාර්ථකාමී ක්‍රියාව (altruistic act) විසින් නිදහස පිළිබඳ අරගලයේ නායකයෙක් වන වික්ටර් ලැස්ලෝ තම අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට මානසික පහසුව හා සමබරතාව සපයයි. එම ළඟාවීම කෙරෙන්

ලැබෙන්නා වූ ප්‍රතිඵලය රික්ට හා එල්සාට පමණක් නොව සමස්ත මානව වර්ගයාගේ ම හිත සුව පිණිස වේ. නමුත් කාන්ටියානු 'යහපත පිළිබඳ ක්‍රියාව' මේ ප්‍රතිඵලයට අපේක්ෂාවෙන් ගන්නා තීරණයක් නොවේ. එසේ වුව ද 'යහපත් ක්‍රියාව' මගින් වඩාත් යහපතක් කරා මනුෂ්‍ය වර්ගයාට ළඟාවිය හැක. ඒ සඳහා රික් කරන්නා වූ තම පුද්ගල ආත්මාර්ථයට හා (සන්තෘෂ්ඨිය) එරෙහි තමා ආශා කරන්නා වූ ගැහැණිය අත්හැරීම නම් ක්‍රියාව සැබෑ ආදරය පිළිබිඹු කරන්නකි. එමෙන් ම ඇය ආදරය හා විවාහය තුළ වගකීම යන අරගලය තුළ වික්ෂිප්ත ව සිටින විට ඇයට ලැස්ලෝ සමඟ යෑමට ඉඩ සැලසීම විසින් ඇගේ මානසික, ආචාරධාර්මික පටලැවිලි සහගත බවෙන් මුදවා ගැනීම හරහා ඇගේ සතුට රික් අපේක්ෂා කරයි. ඒ වෙනුවෙන් ඔහු ගෙවන වන්දිය තම පුද්ගල සතුටයි. නමුත් ඇය සදාචාර යහපත දෙසට යොමු කිරීමෙන් උපයා ගන්නා සැබෑ සතුට විසින් රික් තම ආදරය උත්කර්ෂවත් දෙයක් බවට පත් කර ගනී.

අනෙක් අතට ඈ තමාට ස්ථිර ව ලබා ගැනීම වෙනුවට ඇයට ද ලැස්ලෝ සමඟ විමුක්ති අරගලය සඳහා එක්ව සටන් කිරීමට අවස්ථාව දීම (ඇයව සතු කර ගෙන කැසබ්ලන්කාහි තම පෙම්වතිය ලෙස පමණක් තබා ගන්නවා වෙනුවට) ඇයට ද ස්ත්‍රියක් ලෙස විශ්වීය වීම සඳහා (ඇයට වඩා ඇය බවට පත්වීමට – more than herself) දෙන මහඟු අවස්ථාවකි. එය හුදු පෙම්වතියක් කර ගන්නවාට වඩා ඇයට විශාල මිනිසෙක් වීමට දෙන ඉඩකඩක් ලෙස ගතහොත් එය වඩාත් විශිෂ්ට ලෙස තම ආදරය ප්‍රකාශනය වීමක් ලෙස සම්භාව්‍ය අර්ථයකින් විග්‍රහ කළ හැක. එනම් පෙම්වතියක් පෙම්වතියක් කර ගැනීම තුළ අර්ථවත් නොවන ආදරයක් (ආදරයට වඩා වැඩි ආදරයක්) ඇය විශ්වීය වටිනාකම් හා ක්‍රියාවන් සමඟ සුසංවාදී කිරීම මඟින් ව්‍යුත්පන්න කර ගත හැකි ය. ආදරය තුළ ම අර්ථවත් නොවන ආදරයක් විශ්වීයත්වය තුළට (ආදරය ම ඉක්මවා යන්නක් ලෙස) ඇය මුදාහැරීම මගින් ඇයගේ ශරීරයෙන් මරණ ආශය කරා දිවෙන විනෝදය සොයා යනවාට වඩා පුරුෂ ලෝකයක් තුළ වඩා විශාලනය (වර්තමාන ධනවාදී ලෝකය තුළ ලිංගික උපකරණයක් ලෙස වෙළඳපල තුළ විකුණන්නේ ඇගේ විශාලනය කරන ලද ශරීර කොටස්ය) කරන ලද බලවත් ගැහැණියක් අපට අපගේ ශිෂ්ටාචාරය තුළ නිෂ්පාදනය කර ගත හැක. රික්ගේ 'මුදාහැරීම නම් වූ ආදරය' මගින් ඉගෙන ගත හැකි විශ්වීය හැඟවුම එයයි. බල්ලන් මරා හෝ සල්ලි ඉහායා ගෙන හොඳින් පවුල් කෑම උත්කෘෂ්ඨ පුරුෂාර්ථයක් වී ඇති වර්තමාන ලාංකික සමාජයට කැසබ්ලන්කා චිත්‍රපටය රැගෙන එන විරෝධාකල්පික අර්ථය එයයි. වඩාත් ම හොඳින් පවුල් කෑ මිනිසුන් වීරයන් සේ ඉතිහාස පොත්වල ලියවී නැති අතර මිනිසාගේ යහපත වෙනුවෙන් කැප වූ මිනිසුන් නම් වීරයන් ලෙස (වීරයන්ට පවුල් තිබී ඇත) සඳහන් ව ඇත. මිනිසුන් තමාව විනිශ්චය හා නිර්ණය කරන්නා වූ සාධක ලෙස උත්පත්තිය, ධනය, බලය, ගරුත්වය හා දැන උගත්කම යන දේවල් පාවිච්චි කළ ද කාන්ට් ඒ සෑම දෙයක් ම තමාව ම රැවටීමට හසු කරන ව්‍යාජ අදහස් හා මිත්‍යාවන් ලෙස බැහැර කර මානව සමානාත්මතාව හා මිනිස් වටිනාකම් (virtues) වඩා වැදගත් කොට සලකයි. "මානව ආදරය (philanthropic love) කාන්ටියානු සදාචාරයේ අත්‍යවශ්‍ය සාධකයක් වන අතර එය පාර භෞතික ස්වභායක් උසුලන බව ද කියයි" (වුඩ් 1999: 38-39). ශුද්ධ හේතුව මගින් පැණනගින එය ආත්මාර්ථකාමී නොවූ ප්‍රතිඵලයක් බලාපොරොත්තු නොවන වගකීමේ විධානය විසින් ම මෙහෙයවනු

ලැබූ (unselfish beneficence in response to a command of duty) සබුද්ධික ගතිසංස්ථාපනයකි (rational disposition). "කාන්ට්ගේ ප්‍රායෝගික ආදරය හා පරාර්ථකාමී ආදරය අතර බෙදුම්කඩනයේ න්‍යායික ගැටලු තිබුණා වුව ද ඔහු ප්‍රායෝගික ආදරය නිර්වචනය කරන්නේ ආචාර ධාර්මික/ සදාචාර, අන්තර්ගතයක් සහිත ක්‍රියාවක් ලෙයසි" (වුඩ් 1999: 38). කෙසේ වුව ද කැසබ්ලන්කා චිත්‍රපටය තුළ රික් විසින් කරනු ලබන තවත් එක් වැදගත් මානුෂික ක්‍රියාවක් කාන්ටියානු පරාර්ථකාමී ආදරය හරහා අර්ථකතනය කර ගන්නේ කෙසේ දැයි අවධානය යොමු කෙරේ.

අමරිකාව බලා යෑම සඳහා බල්ගේරියාවේ සිට පැමිණෙන තරුණ යුවලක් අන් සෑම අයෙක් ම මෙන් කැසබලන්කාවේ සිර වී සිට රික්ගේ කැෆේ අමරිකානා අවන්හලට පැමිණේ. නාසි වියරුවට බියෙන් නීත්‍යනුකූල නොවන අයුරකින් හෝ වීසා ලබා ගැනීම සඳහා පොලිසියේ ප්‍රධානියාට (රෙනෝ) අල්ලසක් ලබා දීම වෙනුවෙන් මුදල් සෙවීම සඳහා අසාර්ථක උත්සාහයක නිරත වන තරුණයා රික්ගේ කැසිනෝ මේසයේ පරාජිතව ක්‍රීඩා කරන අවස්ථාවේ තරුණිය පැමිණ රික්ගෙන් පොලිසියේ ප්‍රධානියාගේ තොරතුරු විමසයි. ඇය පැටලිලි සහගත ලෙස අසා සිටියේ පොලිස් ප්‍රධානියා වීසා ලබා දෙන මාර්ගයෙන් ඇය ව ලිංගික ව සූරා කෑමට ගැනීමට උත්සාහ කරමින් සිටිනවා ද යන්නයි. මන්ද මුදල් නැතිව වුව ද ඇයට උදව් කිරීමට ඔහු කැමති බව ප්‍රකාශ කර ඇති නිසයි. නමුත් රෙනෝගේ ගති ස්වභාවය දන්නා රික් ඔහු එන්නේ මොකාට දැ යි අවබෝධ කර ගනී. මෙහි දී ඇය රික්ගෙන් අසන්නේ ආදරයේ අවිච්ඡින්නතාව වෙනුවෙන් යම් වරදක් කර එම වරද සදාකාලයට ම සඟවා ගෙන සිටී ම ආදරයේ නාමයෙන් වරදක් වන්නේ ද යන්නයි. (වෙනත් වචනයෙන් කිවහොත් දෙදෙනාගේ අමරිකානු ගමන සඳහා රෙනොගේ කැමැත්තට ඉඩ දී වීසා ලබා ගෙන එම රහස තම ප්‍රේමවන්තයාට සදාකාලික ව සඟවා ගෙන සිටීම ආචාරධාර්මික ව නිවැරදි ද යන්නයි). ඇය තවදුරටත් අසන්නේ ඔබට (රික්ට) යමෙක් ආදරය කර එම ආදරයේ චිරස්ථිතිය වෙනුවෙන් යම් වරදක් කර එම වරද සඟවා ගෙන සිටියා නම් ඔබ කරන්නේ කුමක් ද යනුවෙනි. රික් වහා ම කලබලයෙන් පිළිතුරු දෙන්නේ 'එතරම් කවුරුත් මට ආදරය කර නැති' බවත්, වීසා ප්‍රශ්නයේ දී තම ශරීරය කාටවත් විකුණන්නේ නැතිව 'ආපසු හන්ගේරියාවට යන' ලෙස යි. නමුත් පෙම්වතුන් දෙදෙනාගේ මානුෂීය සම්බන්ධය මෙම අශ්ශීල ගනුදෙනුකාරිත්වය මැද විනාශ වී යා නොදී රික් තම කැසිනෝ මේසයට ගොස් එම තරුණයාට දිනුමක් ලබා දී කියන්නේ 'නැවත මේ පළාතේ නොඑන' ලෙසයි. රික්ගේ මෙම හැඟීම්බර ක්‍රියාවට ස්වකීය අවන්හලේ සිටින සියලු සේවකයන්ගේ ආදර ප්‍රසාදය හිමිවේ. මේ ක්‍රියාව මගින් රික් තම සාවද්‍ය පිට කට්ටුවට (cynical shell) යටින් ඇති මිනිසත් බව හා අචාරවාදී බව අපට පෙන්නුම් කරයි: එම ක්‍රියාව සඳහා ඔහු කිසිවකුගේ උපදෙස් නොගන්නවා මෙන් ම කිසිදු ලාභයක් ද බලාපොරොත්තු නොවේ. ඔවුන් අමරිකාව බලා පිටත්වෙයි යන ප්‍රතිඵලය දෙසවත් රික් අවධානය යොමු නො කරයි. මේ ක්‍රියාව තුළ ඇත්තේ රික්ගේ ආදරයේ පැරණි මතකය පිළිබඳ හැඟීමකුත් ඊටත් වඩා මානව ආදරය (philanthropic love) පිළිබඳ සබුද්ධික භාවයකුත් ය. සියලු විශ්වාසයන් බිඳ වැටෙන මොහොතක පවා මිනිසාට වගකියන ඔහුගේ ස්වභාවය පිළිබඳ දැනුවත් මැදිහත්වීමක් සඳහා සුදානම් විශ්වීය සදාචාර නීතියක් පිළිබඳ ගුප්ත (සැඟවුණු) ඒජන්තයා විසින් ක්‍රියාත්මකභාවය සඳහා ඔහු ව මෙහෙය වීමකි.

විශ්වීය නීතිය, 'අන්තර්-යැපීම හා සාමාජීය අවසන් ව්‍යාපෘතිය

"අප අපට ම කරන්නා වූ ආදරය අපට ආදරය ලබා ගැනීමට ඇති ආශාවෙන් වෙන්කළ නොහැක" (කාන්ට් 1964: 393) යනුවෙන් කාන්ට් සඳහන් කරන ප්‍රකාශය තුළ අනෙකාගේ පැවැත්මත් එම පැවැත්ම මත අපගේ පැවැත්ම ආදරය නම් සංසඨකය හරහා අන්තර් යැපීමක් දක්වා ගමන් කරන අයුරුත් අපට දැක ගත හැකි ය. පුද්ගල පැවැත්ම සඳහා අනෙකාගේ පැවැත්ම අත්‍යවශ්‍ය බව තමා හා තම මනස පමණක් පවත්වනවා යැයි සිතන ලාංකික බුද්ධිමතුන්ට අවම වශයෙන් ආදරය හරහා වත් මෙය නැවත සිතා බැලීමට බල කරන තත්වයකි. මුලදී දැඩි ආත්මාර්ථකාමී ලෙස රික් සඳහන් කරන 'මට අන් අයගෙන් වැඩක් නැහැ. දැන් මට තිබෙන්නේ මා ගැන බැලීමටයි' යන ප්‍රකාශයෙන් ඔහු ඔහුට ම ආදරය කරනවා යැ'යි හැඟී ගියත් ඔහු එල්සාගේ ආදරය ලබා ගැනීමට කරන කැප කිරීම, පෙරුම් පිරීම හා ඇය නැවත හමු වූ විට ඔහුගේ චංචලභාවය මගින් ඔහු ආදරය හා පැවැත්ම සඳහා අතිශයින් ම පරායත්ත ලෙස අන්තර් යැපීමකට මේ සම්බන්ධය තුළ ගමන් කරයි. අනෙක් අතට 'මම මගේ බෙල්ල බේරා ගන්නවා, මම අනික් අයට පිහිට වන්නේ නැහැ' යන සඳහන චිත්‍රපටය ආරම්භ වී ටික වේලාවකින් උගාටි සම්බන්ධයෙන් කිරීමෙන් හා ඔහුට පොලිසියට අල්ලා ගැනීමට ඉඩ දීමෙන් (උදව් නොකිරීමෙන්) ඔහුගේ ආත්මාර්ථය හා ඔහුට ම කරන ආදරය ප්‍රකට වුවත් චිත්‍රපටය ගලා යද්දී ඔහු අනෙකාගේ ආදරය ලබා ගැනීම වෙනුවෙන් වෙහෙසීමත්, ලාභයක් නොතකා අනෙක් අයගේ ආදරය වෙනුවෙන් කැප කිරීම් කිරිමත් මත ඔහුගේ-පුද්ගල-සමාජීය අන්තර් යැපීම පැහැදිලි වේ. නමුත් වඩා වැදගත් වන්නේ එම පුද්ගල ආදරය මෙන් ම ව්‍යාපාරික ලාභය යන කරුණු ඔහු තමාගේ ජීවිතයේ අවසාන නැවතුම (end point) නැතහොත් අවසාන ව්‍යාපෘතිය ලෙසට අභ්‍යන්තරීකරණය නොකරගෙන තිබීමයි. බැලූ බැල්මට ම ඔහු පුද්ගල ආදරය ඉක්මවා යමින් විශ්වීය ලෙස මානව වර්ගයාට නිදහස ලබා දෙන සටනක් ජීවිතයේ අවසාන අර්ථය (ව්‍යාපෘතිය) ලෙස සලකනු අපට දැක ගත හැකි ය. චිත්‍රපටයේ මුල සිට ම ඔහුගේ රැඩිකල් කැරළිකාරී ඉතිහාසය පිළිබඳ සාක්ෂි අපට රේනෝ මෙන් ම මේජර් ස්ට්‍රෙසර්ගේ තොරතුරු හරහා ද එළිදරව් වේ. නමුත් පුද්ගල ආත්මාර්ථය හා සමාජීය මැදිහත් නොවන බව රික් පවත්වා ගෙන යන්නේ ඉතා ම මතුපිට තලයකයි. නැතහොත් එක්තරා ආකාරයකට සතුරා නොමග යවන සුළු ආකාරයටයි.

උදාහරණ ලෙස අවසන් දර්ශනය සඳහා චිත්‍රපටය තුළ දිගහැරෙන වීසා බලපත්‍රය ලැස්ලෝට හා එල්සාට දීමට රික් භාවිත කරන උපක්‍රමය දැක්විය හැකි ය. ඔහු තම සැලැස්ම රෙනෝට එළිදරව් කරන්නේ සම්පූර්ණයෙන් ම තමා හා එල්සා අමෙරිකාවට යැමට සැලසුම් කර ගත් බවට වූ පුද්ගල ආත්මාර්ථය හා සතුට පදනම් කර ගත් පසුබිමකිනි. රෙනෝ මෙය තරමක් සැක කළ ද බහුතරයක් මිනිසුන් පුද්ගල ආත්මාර්ථය මත අවසන් තීරණ ගන්නා හෙයින් (කාන්ටියානු මානවීය ආදරයට ප්‍රතිපක්ෂව පුද්ගල ආදරය) රෙනෝ පවා මෙය එක්තරා දුරකට විශ්වාස කර ඒ අනුව ක්‍රියා කරයි. රික් තම සැබෑ සැලසුම (original plan) කිසිවකුට එළි දරව් නොකර මතු පිට ආත්මාර්ථය තමාට පිටතින් වූ සමාජයට ඒත්තු යන ලෙස ක්‍රියා කරයි. මෙම රහසිගත බව හා ගුප්ත ස්වභාවය ඇතැම් අවස්ථාවල දේශපාලන හා විමුක්ති අරගලවල දී අත්‍යවශ්‍ය වේ. නමුත් බොහෝ විට

මිනිසුන් අගය කරන්නේ මතු පිට රැඩිකල් බවයි. එය ද ඉතා ම අවශ්‍ය වන අතර ඉතා තීරණාත්මක අවස්ථාවල තම අනන්‍යතාව එළිදරව් නොකිරීම ද අවශ්‍ය වේ. මෙය අරගලයක දී අදාළ සටන් තත්වයන් යටතේ තීරණය කළ යුතු සාධකයකි. නමුත් අවසන් මොහොතේ රික් තම ඉතා ම සමීප මිත්‍රත්වය තුළ සිටි රෙනෝට පවා තම ගිනි අවිය පෙන්වා තම නිදහස පිළිබඳ ස්වාමි හැඟවුම සමඟ අනන්‍ය වෙමින් ලැස්ලෝගේ හා එල්සාගේ පැනයෑම වෙනුවෙන් ක්‍රියා කරයි. අන් කිසිවෙක් නොකළ ආකාරයකට ඔහු මේජර් ස්ට්‍රසර්ට පවා වෙඩි තබයි. එම ක්‍රියාවේ වැදගත්කම අවබෝධ කර ගන්නා පොලිස් ප්‍රධානී රෙනෝ පවා අවසන් මොහොතේ රික්ගේ පාර්ශවය නියෝජනය කරමින් 'සාමාන්‍යයෙන් අත්අඩංගුවට ගන්නා සැකකරුවන් වටලන්න'යැයි නියෝග කරයි (රික් සාමාන්‍ය සැකකරුවෙක් නොවේ!). මෙහි දී නිදහස වෙනුවෙන් කරන මානව අරගලයේ වැදගත්කම වෙනුවෙන් එහි ස්වාමි හැඟවුම සමඟ රෙනෝ අනන්‍යවීම හදිසි හැඟිම්බර අහම්බයක් නොව ඔහු පවා දීර්ඝ කාලීන ව අනන්‍යවෙමින් තිබූ දෙයකි. රෙනෝ මේජර් ස්ට්‍රසර්ට එක් අවස්ථාවක 'ඔබ ඇත්තට ම නියෝජනය කරන්නේ කවි ද? යැ'යි අසා සිටින විට පිළිතුරු දෙන්නේ, 'මම සුලඟ හමන දිහාවම යන කෙනෙක්. මේ වේලාවේ සුළඟ ජර්මනිය දිහාවට, මමත් ඒ දිශාවට' යනුවෙනි. මෙය ඔහුගේ සාමාන්‍ය පැවැත්ම හා භාවිතය සම්බන්ධයෙන් සත්‍යයක් වුවත් ඔහු සැබැවට ම විශ්වාස කරන දෙය සමඟ සත්‍යයක් දැයි නැවත සිතා බැලිය යුතු ය.

රෙනෝගේ භාවිතය හා රික්ගේ භාවිතය පැහැදිලිව ම දෙකක් වන නමුත් දැඩි පුද්ගල ආත්මාර්ථයන් තුළ සිටින මිනිසුන් පවා තීරණාත්මක නිමේෂයන්හි දී තම හෘද සාක්ෂිය හා සාධාරණය වෙනුවෙන් තම ක්‍රියාව මෙහෙයවයි. එවිට ඔවුන් තම එදිනෙදා පැවැත්ම සඳහා කරන සාමාන්‍ය ක්‍රියාවෙන් ඔබ්බට ගොස් විශ්විය වටිනාකම් හා අනන්‍ය වේ., වැදගත් වන්නේ සමාජය තුළ මෙවැනි වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමයි. විශේෂයෙන් අද දවස වන විට වෙළඳපල මුල් කර ගත් ධනේශ්වර සමාජය විසින් යහපත-අයහපත හා හොඳ-නරක පිළිබඳ පරමාදර්ශයන් බිඳ දමමින් තිබෙන යුගයක මිනිසුන් ලෙස අප අපගේ සතුට නොව අනෙකාගේ සතුට කේන්ද්‍ර කර ගත් වඩා සාධාරණ වූ විශ්වයක් වෙනුවෙන් වන පොදු වටිනාකම්හි පැවැත්ම වෙනුවෙන් ශ්‍රමය කැප කිරීම අත්‍යවශ්‍ය මොහොතකට ළඟා වී ඇත. කාන්ට් හැදෑරීම තවදුරටත් ඉතා වැදගත් යැයි සඳහන් කළ යුත්තේ පශ්චාත්-නූතනරුද ලෝකය මිනිස් චින්තනයේ හා ක්‍රියාත්මකභාවයේ නිදහස වෙනුවෙන් මෙන් ම සමානාත්මතාව වෙනුවෙන් කරන්නා වූ නිම නොවූ අරගලයක නිමග්න වී ඇති හෙයින් ය. ඒ අර්ථයෙන් මිනිස් ක්‍රියාව වඩ වඩාත් එදිනෙදා පැවැත්ම අරමුණු කර ගනිමින් සිදුවන බැවින් එය ආචාරධාර්මීය ක්‍රියාවෙන් වෙන් කර ගන්නේ කෙසේ ද යන්න තෝරා බේරා ගැනීම සඳහා කාන්ට්ගේ ආචාර ධාර්මික ක්‍රියාව පිළිබඳ න්‍යායික්ව පැහැදිලි කර ගත යුතුය.

අනෙක් අතට සිංහල පාඨක ප්‍රජාව සඳහා කාන්ට්යානු දර්ශනය ආශ්‍රිත ව ගොඩනැංවී ඇති පුළුල් න්‍යායික ප්‍රවේශයෙන් සිංහලෙන් පළ වී නොතිබීම නිසා මෙම ව්‍යායාමය උපයෝගිතා පදනමකින් වැදගත් වේ යැයි හැඟේ. විශේෂයෙන් ම විශ්වීයත්වය හා වටිනාකම් පිළිබඳ ඉතා ම මෑතක පවා ගොඩනැංවී ඇති පශ්චාත් නූතනත්වය එරෙහි ව ඇති ප්‍රධාන ම කතිකාවේ එක්

පාර්ශවයක් නියෝජනය කරන යර්ගන් හබමාස්(1981: 2) ගුරු කොට ගන්නේ කාන්ටියානු විශ්වීයත්වය හා පශ්චාත් පුනරුද නූතනත්වයේ නො-අවසන් බව පාදක කර ගනිමින් දිග හැරුණු කතිකාවයි.

කාන්ට්ගේ ආචාර ධර්මීය ක්‍රියාව පිළිබඳ නිරීක්ෂණයක්

කාන්ට්ට අනුව 'අචාර ධර්මීය ක්‍රියාව යනු හොඳ නරක හා හරි වැරැද්ද පිළිබඳ ව වන විශ්වාසය හා අනුගත වීමේ ක්‍රියාව ආචාර ධර්මීය ක්‍රයාවයි' (කාන්ට් 1964: 211) එහි දී කාන්ට් ආචාර ධර්මීය ක්‍රියාව 'යුතුකම' හා සම්බන්ධ කරයි. මෙහි දී යුතුකම යනු (1964: 397)'යහපත් චේතනාව විසින් යුතුකම සඳහා ම ක්‍රියා කිරීමට මෙහෙය වීමේ ප්‍රේරණය' ලෙස හඳුන්වන ඔහු 'යහපත් චේතනාව කුමන බාධා පැමිණියත් කෙතරම් මතු පිටට නොපෙනී තිබුණත් සියලු බාධා හා සීමාකම් පසු කරවිත් වඩවඩාත් දීප්තිමත්ව බබලනවා වූ චේතනාව ලෙස කාව්‍යමය බවකින් කියා සිටී. කාන්ට් ආචාර ධර්මීය ක්‍රියාව කොටස් දෙකකට බෙදයි.

I. කොන්දේසි සහිතः යමක් තවත් යමක් සිදුවීම වෙනුවෙන් කිරීම (උදාः ත්‍යාගයක් බලාපොරොත්තුවෙන් හෝ ප්‍රතිඵලයක් සඳහා ක්‍රියා කිරීම)

II. කොන්දේසි රහිතः ප්‍රතිඵලයක් බලාපොරොත්තු නොවී යමක් එය සඳහාම ඉටු කිරීම.

මෙම දෙවැනි කොන්දේසි රහිත (unconditional) ක්‍රියාව කාන්ට් විස්තර කරන්නේ 'ක්‍රියාවක් කළ යුතු ය යන ආචාර ධර්මය එහි ඵලය මත රඳා නොපවතී' (වුඩ් 1999: 41) යනුවෙනි. එය තවදුරටත් විස්තර කළහොත්, එයින් ගම්‍ය වන්නේ 'ක්‍රියාවක් කිරීමේ උත්ප්‍රේරණය එහි ප්‍රතිඵලයෙන් උකහා නොගත යුතු ය' (වුඩ් 1999: 42) යන්නයි. ක්‍රියාව කරන්නා හා එම ක්‍රියාවට භාජනය වන්නා මගින් මතුවන ප්‍රතිඵලය අතර උපයෝගිතා සම්බන්ධය බන්ධනය කිරීමක් මෙහි දී දැක ගත හැකිය.

රූප සටහන 1

(a)

ක්‍රියාව කරන්නා / ඒජන්තයා

↓

(b)

ක්‍රියාවට පාත්‍ර වන්නා/ වස්තුව

} (c) එහි ප්‍රතිඵලය පිළිබඳ සවිඥානිකත්වය

මෙහිදී (a), (b) හා (c) අතර ඇති ප්‍රතිඵලාත්මක අන්තර් සම්බන්ධය (consequential interrelationship) බන්ධනය කිරීමෙන් කොන්දේසි විරහිත අචාර ධර්මීය ක්‍රියාව සිදු වේ. මෙහි දී කාන්ටියානු ආචාර ධර්මීය ක්‍රියාව මෙහෙයවනු ලබන්නේ නිරූපාධික ප්‍රගම්‍ය (categorical imperative) මගිනි. මෙය විධානයක්

ලෙස ක්‍රියාත්මක වේ. මෙම නිරුපාධික ප්‍රගම්‍ය මේ වන විටත් ගොඩනඟා ඇති අවසානයක් පිළිබඳ අභිප්‍රාය සමඟ සාපේක්ෂ නොවෙමින් (මෙයින් අදහස වන්නේ සදාචාර ක්‍රියාවක් සඳහා අවසානයක් නැති බව නොවේ) මිනිසාට ක්‍රියාත්මක වීමට උත්ප්‍රේරණය ඇති කරයි. "ඇත්ත වශයෙන් කාන්ට්ට අනුව කිසිදු ක්‍රියාවක් අවසානයකින් මුක්ත නොවේ" (වුඩ් 1999:70). ආචාරධාර්මික නීතිය කොන්දේසි විරහිත ව නිර්-සංවිපාකාත්මක ව (non-consequential) ක්‍රියාත්මක වන ප්‍රායෝගික නීතියකි (practical law). මෙවැනි ක්‍රියාවක් නියෝජනය කිරීමේ දී ඇති වන සතුට හෝ අසතුට අනුභූතික තත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස පමණක් ගත යුතුවන හෙයින් ද, ස්වකීය ආශාවේ වස්තුව (object of desire) සමඟ සමුද්දේශනයක් (reference) වලක්වාලන හෙයින් ද එය පූර්වයක් (priori) ලෙස සැලකේ. මෙම කාන්ටියානු පූර්වය අචාරධර්මීය මූලධර්මයක් (moral principle) ලෙස මිනිසාගේ අත්දැකීමට (අනුභූතියට) පූර්වයෙන් පැවතිය යුතු විශ්වීය නීතියක් ලෙස කාන්ට් දක්වයි.

> "අපගේ ඇස් කන් වලින් පැමිණෙන ඉන්ද්‍රිය සංවේදන (sensory perceptions) තොරතුරු වලින් විනිර්මුක්තව ආත්මීය පර්කල්පනයක් (spiritual perception) හරහා ලබා ගන්නා දැණුමක් ලෙස මෙම විශ්වීය පූර්වය කාන්ට් නම් කරයි." (වුඩ් 1999: 36).

මෙහි දී කාන්ට් කියන්නේ අත්දැකීම යනු පූර්වයකට අත්‍යවශ්‍ය එක් කොන්දේසියක් ලෙස යි. ඒ නිසා ඔහු තම විශිෂ්ට කෘතියක් වන Critique of Pure Reason (1781) ග්‍රන්ථය ආරම්භ කරන්නේ 'සියලු ඥානනය අත්දැකීමෙන් ආරම්භ වේ' (2007: 36) යනුවෙනි.

කාන්ට්ගේ තවත් ඉතා වැදගත් ප්‍රකාශයක් නම් 'සදාචාරමය ක්‍රියාව නම් නිදහස ක්‍රියාවට නැඟීමයි' යන්නයි. ඒ අනුව මානව නිදහස හා සදාචාර ක්‍රියාව දෙකක් නොව එකක් ලෙස දක්වන කාන්ට් මේ දෙක අතර අන්‍යෝන්‍ය බන්ධනය පිළිබඳ ව සඳහන් කරන්නේ 'නිදහසේ පූර්ණත්වය යනු අචාරධර්මීය ක්‍රියාව' යනුවෙනුයි. මෙයින් කියවෙන්නේ පූර්ණ මිනිස් නිදහසකින් තොර ව අචාර ධර්මීය ක්‍රියාව පැවතිය නොහැකි බව මෙන් ම ඒ සඳහා මිනිසාට ක්‍රියාත්මක විය නොහැකි ය යන්නයි. මෙහි දී ක්‍රියාත්මක වීම යනු කිසියම් මූලධර්මයක් මත සිට ක්‍රියාත්මක වීමයි. අචාරධර්මීය ස්වාධිපත්‍යය යනු මේ ආකාරයට ක්‍රියාත්මක වීමට මිනිසාට ඇති අසීමිත නිදහසයි (limitless freedom). සියලු නිරුපාධික ප්‍රගම්‍යයන් (categorical imperatives = priori) ඉහත කී අචාරධාර්මික ස්වාධිපත්‍යය මත පිහිටා ඇත. පංචේන්ද්‍රියන්ගෙන් අත්දැකීමට පූර්වයෙන් පවතින්නා වූ 'ස්වයං විඥානයක්' වන කාන්ටියානු පූර්වය මිනිසා 'ආනුභූතික අපෝහනයක්' (self-consoious transedential deduction) ඔස්සේ ලබා ගත යුතු වන බව කාන්ට් සඳහන් කරයි. ඒ අනුව ස්වයං-සවිඥානය කාන්ටියානු දර්ශනයේ උත්තරීතරම අංගයක් වේ. අචාර ධර්මීය ක්‍රියාව අත්දැකීමෙන් වියුක්ත වුව ද ස්වභාවධර්මයේ අනෙකුත් නීතිරීති අප අත්දැකීමෙන් අවබෝධ කර ගත යුතු බව කාන්ට් සඳහන් කරයි. උදාහරණයක් ලෙස කැසබලන්කා චිත්‍රපටයේ රික් පෙන්වන ආත්මාර්ථය ඔහුගේ පැවැත්මේ ආනුභූතික අවබෝධය මත ඩහුහගත වුවකි. නමුත් තම ආශාව හා පහසුව අත්හැර ඔහු ලැස්ලෝට හා ඉල්සාට කැසබලන්කාවෙන් පැන යෑමට කරන උදව්ව විශ්වීය අචාරධාර්මික

ක්‍රියාව තුළ තේරුම් ගත යුතු ය. මේ දෙක අතර ගැටුම (එම උදව් කිරීමේ දී ඔහු කරන පුද්ගලික අත්හැරීම් නම් වන්දිය) ජිජැක් දක්වන අශ්ශීලත්වය ලෙස චිත්‍රපටයේ සමස්තය ගොඩ නැංවීමේ දයලෙක්තිකය ඉස්මතු වේ.

රූප සටහන 2

හොලිවුඩ් සමස්තය අශ්ශීල පිජැකියානු අන්තර්ගතය	↕	පැවැත්මේ අනුභූතික අවබෝධය/ ආත්මාර්ථකාමී මතුපිට (අශ්ශීලත්වය)
		විශ්වීය මානවීය ආදරය හා ආචාර ධාර්මික ක්‍රියාව (ශිෂ්ට බව)

චිත්‍රපටය තුළ එල්සා වීසා පත් ඉල්ලීමෙන් අසාර්ථක ව අවසානයේ රික්ට තමා තවමත් ආදරය කරන බව පවසා තම අතීතය පිළිබඳ ව පාපොච්චාරණය කරයි. ඉන්පසු දර්ශනය කැසබලන්කා ප්‍රදීපාගාර කුළුණ වෙත ගොස් නැවත පෙර දර්ශනයට එනවිට රික් සිගරට්ටුවක් පත්තු කර ගෙන සිටින අතර දර්ශනයේ අන් කිසිවක් වෙනස් නොවී තිබූ අයුරින් ම තිබේ. ලිංගික ක්‍රියාවකින් පසු ආතතිය පහකර ගැනීමේ උපක්‍රමයක් ලෙස රික් සිගරට් බීමත් ප්‍රදීපාගාර කුළුණ නම් ෆැලික සංකේතයත් මත පදනම්ව රික් හා එල්සා ලිංගික ව හැසිරුණ බවට අශ්ශිල සංඥාවක් චිත්‍රපටකරු චිත්‍රපටයට එක්කර ඇත. හොලිවුඩ් සිනමාව ක්‍රියාත්මක වන්නේ තේමාවේ මහේෂික ශිෂ්ටකරණය ව්‍යාපෘතිය තුළ ම චලනය වන අශ්ශීල සංඥාවක් හරහා බව ජිජැක්(2001: 14) සඳහන් කරයි. මිනිස් ශිෂ්ටකරණය ව්‍යාපෘතිය 'සබුද්ධික හේතුව' මත පදනම් වන අතර අශ්ශීල ලිංගිකත්වය ස්වාභාවිකත්වය හා සම්බන්ධ වේ. මේ දෙක අතර දයලෙක්තික අරගලය මිනිස් ශිෂ්ටාචාරය තුළ තවමත් නොවිසඳී පවතී.

ස්වාභාවික නීතිය අප මිනිස් සහජ ඥානය (intuition) මත රඳා පැවතෙන සාපේක්ෂ තත්වයක් වුව ද 'හේතුව' එසේ නොවේ. මිනිසාගේ කැමැත්ත, මිනිසාගේ ආශාවන්, හැඟීම් හා තත්වයන් මත පැවැත්මේ කොන්දේසි හා සහජ ඥානය රඳා පැවතුනත් මිනිසාගේ 'යුතුකම' යන්න නිරුපාධික වේ. මෙම නිරුපාධික යහපත විසින් ලෝකය වඩා හොඳ තැනක් ලෙස විපරිණාමය වීම සඳහා මිනිසා මෙහෙයවනු ලබන ගුප්ත ඒජන්තයෙක් ලෙස ක්‍රියාත්මක වේ. නමුත් අප නිරන්තරයෙන් අපගේ අවිඥානය හරහා මෙහෙයවන්නේ සතුට, තෘප්තිය හා හැඟම් (විශේෂයෙන් සහජ සත්ව ආශය) සන්තර්පනය සඳහා ය. කාන්ටියානු යහපත, යුක්තිය හා වගකීම විසින් මිනිසුන් සත්ව තලයෙන් ඔබ්බට ඔසවා ශ්‍රේෂ්ඨයින් බවට පත් කරන්නේ මෙම සත්ව හා සහජ තලය ඉක්මවා මිනිසා ගමන් ගන්නා බැවිනි. ශ්‍රේෂ්ඨ මිනිසුන් යනු තමාට විඳීමට හොඳට ම ඉඩ තිබූ පුද්ගල සතුට සමාජයක් වෙනුවෙන් කැප කළ අයයි. ඔවුන්ගේ කීර්තිය හා උත්කර්ෂය එම කැප කිරීමේ වන්දියයි. භාෂා සංකේතීය ලෝකය තුළ යහපත හොඳ-නරක මේවන විටත් තීරණය වී ඇති නිසා මිනිසා ලෝකය දැන් තිබෙන තැනින් මීට වඩා හොඳ තැනකට ඔසවා තබන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව මේ වන විටත් සවිඥානිකය. ලෝකය ලස්සන තැනක් කිරීම පිළිබඳ ව ප්ලේටෝ සංවාද කළේ ක්‍රි.පූ. 420 දී පමණ බව අප මතක තබා ගත යුතු ය.

රූප සටහන 03

මිනිසා මෙහෙය වන හැඟවුම් දිශාව	↕	සදාචාරය (morality) හා යහපත (ලෝකය තිබිය යුත්තේ කෙසේ ද?)
		පැවැත්ම සඳහා ක්‍රියාත්මක භාවය (ලෝකය ඇත් තිබෙන්නේ කෙසේ ද?)

අපගේ හැසිරීමේ අත්‍යන්ත අවසානය නොහොත් සදාචාර ලෝකය ගොඩ නැගීම සඳහාත් ස්වාභාවික ලෝකය ඉහළට එසවීමටත්, යහපත රැගෙන ඒමටත් ප්‍රායෝගික දර්ශනය භාවිත කරමු. මෙම 'උතුම්ම යහපත' (absolute good) (පරම යහපත) විසින් මෙහෙය වනු ලැබූ 'නිරපේක්‍ෂ මිනිසා' පිළිබඳ ව වූ චිත්‍රපට ගණනාවක් හොලිවුඩ් සම්භාව්‍ය යුධ ෂෝනරය හා නාසි සංහාරය පිළිබඳව වූ ෂෝනරය තුළත් දක්නට ඇත. මෙම උතුම් යහපත සඳහා වූ අවාර ධාර්මික ඇගයුම් (appraisal) පවතින්නේ මිනිසාට සදාචාරවත් අයුරින් මෙන් ම එසේ නොවන අයුරිනුත් කටයුතු කළ හැකි නිසයි. උදාහරණ ලෙස හොරකම සදාචාර සම්පන්න නොවන්නේ යම් මොහොතක දී මිනිසාට අන් අයුරකින් ඔහුගේ පාලනය තුළ කටයුතු කළ හැකියාවක් තිබුණා නම් පමණි. කාන්ට්ට අනුව මෙවන් අවස්ථාවක දඬුවම් දීමෙන් අන් අයගේ චර්යාව පාලනය කළ හැකි වුව ද, න්‍යායික ව එම දඬුවම නිවැරදි නොවේ. 'මාගේ ක්‍රියාව පාලනය කිරීම මා පමණක් සතුවන විට මා නිදහස් වේ. වෙනත් කෙනෙක් හා බලයක් මා ඒ දෙසට තල්ලු කරයි නම් ඉදින් මා නිදහස් නොවේ.' යන කාන්ට්යානු ප්‍රකාශය ඉතා වැදගත් වන්නේ එය මිනිස් නිදහස හා සදාචාරය පිළිබඳ අද දවසටත් අදාල වූ ඉතා ගැඹුරු අර්ථයක් දරා සිටින බැවිනි.

> "ආචාර ධර්මයේ නීති අදාළ වන්නේ නිදහස් මිනිසාට පමණි. එනම් තම පාලනය තුළ තමාගේ චර්යාව පාලනය කළ හැකි අයෙකුට පමණි. එම ක්‍රියාව කරන විට දී නිවැරදිව හෝ එසේ නැතිව කටයුතු කිරීමට නිදහස් අවස්ථාව ඇති කෙනෙකුට පමණි. මෙය සාමාන්‍ය දැනීම මිස දර්ශනය නොවේ" (කාන්ට් 1964: 202).

ඉහත ප්‍රකාශය අප වැනි තුන්වැනි ලෝකයේ දිළිඳුකමින් මිරිකී ඇති, ආර්ථික අසමානතාව ය - ඉහවහා ගිය, ජීවන වියදම එක පිම්මේ ඉහළ යන, මූලික පහසුකම්වත් අහල පහලක නැති සම්පූර්ණයෙන් අසංවිධිත සමාජ සංස්කෘතික රටාවකට උරුමකම් කියන ජනතාවට උදේ හවා සියලු ආගමික නායකයන් තොර තෝංචියක් නැතිව සදාචාර සම්පන්න වීමට යැයි කියන කතිපින්දම් මෙන් ම බලහත්කාරී ප්‍රකාශවලට මහඟු පිළිතුරක් සියවස් එකහමාරක පමණ පෙර විඥානවාදියෙකු ලෙස දී තිබීම පුදුම සහගත ය. මෙයින් අදහස් වන්නේ එම සදාචාර ප්‍රකාශන අසත්‍ය යැයි හෝ ප්‍රත්ක්ෂේප කළ යුතු බව හෝ නොවේ. එයින් කියවෙන්නේ සදාචාර සම්පන්න වීමට අවශ්‍ය 'නිදහස' නම් පූර්ව කොන්දේසිය අප සමාජයක් ලෙස සම්පූර්ණ කර නොමැති බවයි.

සදාචාර සම්පන්න වීමට අවශ්‍ය කොන්දේසි කැසබලන්කා හි වුව ද නොමැති වුවත් රික් තම ප්‍රතිපත්ති බොහෝ විට උල්ලංඝනය නොකිරීමට වග බලා ගනියි. උදාහරණ ලෙස බ්ලූ පැරට් (Blue Parrot) අවන්හලේ හිමිකරු වන ෆෙරාරි, රික් ට කරන යෝජනාව දැක්විය හැකියි. රික්ගේ අවන්හල ද මිල දී

ගැනීමට සූදානම් ඔහු රික් එය විකුණන්නේ නැතැයි කී විට අවම වශයෙන් සෑම් ලබා දෙන ලෙස කියයි. දීර්ඝ කාලයක් රික් සමඟ සිටි පියානෝ වාදකයෙක් මෙන් ම රික්ගේ අවන්හලේ ප්‍රධාන ගායකයා ද වන සෑම් 'විකිණීමට තබා නැති' බව රික් කියයි. එවිට ෆෙරාරි කියන්නේ ('මම මිනිසුන් විකුණන්නේ හෝ මිල දී ගන්නේ නැති බව ද රික් වැඩි දුරටත් කියන විට) 'මිනිසුන් කැසබලන්කාහි ප්‍රධාන පාරිභෝගික භාණ්ඩය' (human beings are the leading commodity here in Casablanca) බවත්' ඒ මගින් තම වාසනාව පාදා ගත හැකි' බවත් ය. මේ සමඟ එකඟ නොවන රික් ඍජුවම පිළිතුරු දෙන්නේ 'ඔබේ ව්‍යාපාරය ඔබ ගෙන යන්න මගේ එක මට වුවමනා විදියට ගෙන යෑමට මට ඉඩ දෙන්න' යනුවෙනි. මිනිසුන් විකිණීම නම් තුච්ඡ ක්‍රියාව ධනේශ්වරයේ වාණිජ ව්‍යාප්තික අවධිය තුළ බහුල වශයෙන් සිදු වුව ද කාර්මීකරණයේ නැඟීමත් සමඟ යන්ත්‍ර සූත්‍රවලට මිනිසා මාරු වීමත් එහි කාර්යක්ෂමතාව ඒත්තු ගැනීමත් සමඟ තව දුරටත් වහල් වෙළඳාම එහි මූලික අර්ථයෙන් අද දවසේ සිදු නොවේ. අද ලතින් අමෙරිකාව අප්‍රිකාව හා ආසියාවේ මිනිසුන් විකිණෙන්නේ වෙනත් සේවා ව්‍යුහයක් තුළ ය. අනෙක් අතට වහල් වෙළඳාම සම්බන්ධයෙන් මතු වූ මානවීය කතිකාව හේතු කර ගෙන යම් ආකල්පමය වෙනස්කම් ද නූතන යුගය තුළ දක්නට ලැබුණි. රික් අපට පෙන්නුම් කරන්නේ මෙම නූතනත්වය තුළ ව්‍යුහගත වූ ඔහුගේ විරෝධාකල්පික මනසයි. තරුණ යුවලට රූලට් දැනුමක් ලබා දීම තුළත්, එල්සාට දිගින් දිගට ඔහු කරන පෙරුම් පුරන ආදරය තුළත්, ඔහුගේ බිම්ගත නාසි විරෝධය තුළත්, මුදල් දුන්න ද බලවතුන් වෙනුවෙන් නොව පීඩිතයින් වෙනුවෙන් සටන් කිරීම තුළත්, වීසා ගනුදෙනු තුළ ඔහුගේ භූමිකාව තුළත් අපට දක්නට ලැබෙන්නේ හොඳ නරක පිළිබඳ ආචාර ධාර්මික බන්ධයක් තම මනස තුළ සලකුණු කරගත් නිශ්චිත මොහොතක දී ක්‍රියාත්මක වන සබුද්ධික රික් නම් නූතන මිනිසෙකි.

ඔහු රොමෑන්තික ලෙස සටන් කිරීමට ගොස් සටන් කිරීම ද තමා ද යන දෙකම විනාශ කර ගන්නෙක් නොවේ. ලාංකික සටන් ඉතිහාසය තුළ සිදු වූ ප්‍රධාන ම දෙය නම් සටන්කරුවන් මිය යෑම මතු නොව නැවත සටන් කිරීමට අවශ්‍ය වන මානසික හා ද්‍රව්‍යමය තත්වයන් දෙකම විනාශ කර ගැනීමයි. මේ නිසා ලාංකික දේශපාලන ඉතිහාසය තුළ ගොඩනැඟ ඇති නාස්තික බව සුළු පටු නොවේ.

යුද පසුබිම තුළ ඔහුගේ මිත්‍ර ලුයී (පොලිස් ප්‍රධානී) ස්ත්‍රී ලෝලියෙක් වන විට ඔහු එල්සාට ආදරය කරයි. ලුයී 'සුළඟ යන අතට තමනුත් යනවා යැයි' කියන විට රික් හැකිතාක් තම ප්‍රතිපත්ති තුළ ජීවත් වීමට උත්සාහ ගනී. ලුයී මුදල්වලට වීසා විකුණන විට රික් එම ක්‍රියාවට අත නොගසනවා පමණක් නොව තම හිතවතෙකු වූ උගාටි වීසා විකිණීම කරන 'අතරමැදි ලාභය' (cut rate) ද විවේචනය කරයි. එමෙන් ම ඍජුව ම ලැස්ලෝ අගය කිරීමට ද ඔහු පසුබට නොවෙයි. 'අප හැමෝම වැඩ කලත් ඔබයි සාර්ථක වන්නේ' යැයි ඔහු ලැස්ලෝට කියයි. එල්සා ගනුදෙනු ආකාරයකට තමාගෙන් වීසා ලබා ගැනීමට උත්සාහ කරනවා යැයි ඔහුට හැඟී ගිය එක් අවස්ථාවක 'මේ ලාභ වෙළඳාමක්'යැයි උත්ප්‍රාසයෙන් කියයි. අවසානයේ තමා ලොව වැඩියෙන් ම ආදරය කළ ගැහැණිය සටන්කරුවකුගේ මානසික තුල්‍යතාව වෙනුවෙන් කැප කර තමාට තමාගේ ලාභය හෝ අභිමතාර්ථ වෙනුවෙන් පාවිච්චි කිරීමට තිබූ වීසා පත් ඔවුන් වෙනුවෙන් ලබා දෙයි. ආර්ථික සාධක විසින් පොළඹවන ලද, තම

මිත්‍රයන් ආචාර විරෝධී ක්‍රියාවන්හි දිගින් දිගට ම නිරත වනු දැක දැක, තමා විශ්වාස කරන දෙය ඉක්මන් ජයග්‍රහණයක් කරා නොයන, තම මිත්‍රයන් හා ගණුදෙනුකරුවන් තමා බලා සිටිය දී මිය යන අවස්ථාවක රික් ඔහුට හැකි හැම අවස්ථාවක ම තම විශ්වාසය වෙනුවෙන් ජීවත් වීම, ක්‍රියා කිරීම හා තමාට ආවේණික ස්වභාවයකින් සටන් කිරීම විශේෂයෙන් ඇගයීමට ලක් කළ යුතු ය. ඔහු තුළ ද ඇති ඇතැම් ගණුදෙනුකාරී හා බිම්ගත ලක්‍ෂණ (උදාහරණ ලෙස ඔහුගේ අවන්හලේ රූලට් ක්‍රීඩාව තුළ අක්‍රමිකතා සිදුවන ඔහු හොඳින් දන්නවා පමණක් නොව ඔහු ද එම අවස්ථාව පාවිච්චි කරයි.) අවසන් විග්‍රහයේ දී වඩා මානවීය යහපත දෙසට (උදාහරණ නම් එම රූලට් ක්‍රීඩාව තමා විසින් ම පාවිච්චි කර එම මුදල් යම් ආදරවන්තයින් දෙදෙනෙකුගේ ස්ථාවරත්වය වෙනුවෙන් වැය කරයි. මෙය කෙනෙකුට රොබින්හුඩ් වර්ගයේ ලක්‍ෂණයක් ලෙස දැකිය හැකිය.) දිශානත කිරීම ඔහුගේ වඩා අචාරධර්මීය හා මානවීය ලෝකයක් පිළිබඳ ගුප්ත හැඟවුම කෙරෙහි ඇති විශ්වාසය ප්‍රකට කරන්නකි. මෙම චරිතය අමෙරිකානු වීරයෙක් බවට පත්වන්නේ ඉහත තතු යටතේ විය හැක. කේවල පුද්ගලත්වයන් ලෙස මිනිසා නූතන අර්ථයෙන් මහේෂ්ක අරගලයට සම්බන්ධ වන්නේ තමාට ම ආවේණික අයුරකින් වන අතර ඔහුගේ පුද්ගල පෞරුෂ ලක්‍ෂණයන් ප්‍රතිජානාත්මක ලෙස මෙන් ම නිශේධනාත්මකව ද අරගලය තුළ ප්‍රතිබිම්බනය විය හැකි වුවත් ඇතැම් විට සුවිශේෂ පෞරුෂ ලක්‍ෂණ හරහා මිනිසුන් අරගලයට මැදිහත් වීම මගින් ඇතැම් සුවිශේෂ ප්‍රතිඵලයන් අත්කර ගත හැකි වේ. මිනිසා පූර්ණ ලෙස අරගලයේ දෘෂ්ටිවාදය තුළ යටත්කරණය කිරීම ඔස්සේ පුද්ගල සුවිශේෂතා නිශේධනය කරනවාට වඩා එම සුවිශේෂතා අරගලයේ අරමුණ සමඟ සමපාත කර ගත හොත් මිනිසාට වඩා නිදහසකින් යුක්ත ව අරගලයේ නියැලිය හැකි ය. හැරත් නිශ්චිත දෘෂ්ටිවාදයන් යම් සංවිධාන ව්‍යුහයන් තුළ මිනිසා අභ්‍යන්තරීකරණය කිරීම අත්‍යවශ්‍ය වුවත් ඇතැම් විට මිනිසා නිශ්චිත මෙහෙයවීමකින් හා නායකත්වයකින් තොරව වුව ද සාධාරණය දෙසට ක්‍රියාත්මක විය හැකි ය. එසේ වන්නේ ඇතැම් විශ්විය අචාර ධාර්මික හරි-වැරදි පිළිබඳ ඇති අවබෝධය ගුප්ත ආකාරයකින් ඔහු තුළ ක්‍රියාත්මක වීම නිසා ය. මෙහිදී 'ගුප්ත' යනු ආගමික හෝ ආත්මීය පාර-භෞතිකයක් නොව ඒ පිළිබඳව මිනිසා දක්වන ගැඹුරු සවිඥානිකත්වයයි. බාහිර ලෝකය කොරතම් අපිළිවෙළ (රික් අත්දකින කැසබල්න්කාව මෙන්) වුවත් මෙම සැඟවුණු ඒජන්තයා සංකේතීය ක්‍රියාදාමය (mechanism) ඔස්සේ ලෝකය සංකේතනය කර, ව්‍යවස්ථාගත කර, ව්‍යුහගත කර තිබෙන තත්වයක් තුළ අප අත්දකින දෙය 'එය එහිම ස්වභාවය' නොවන (ජිජැක් 2008: 241) බැවින් මෙන් ම සැමවිට ම මිනිසා තත්වයන් වඩා යහපත් කිරීම සඳහා වූ ප්‍රේරණයක් ප්ලැටොනික අර්ථයකින් දරා සිටී හා ඒ සඳහා ක්‍රියාත්මක වීමට උත්සුකවීමේ ගම්‍යතාව සංකේතීය ප්‍රබන්ධයක් (symbolic fiction) මතින් නියාමනය කෙරෙන (regulated) බැවිණි. නමුත් මේ සඳහන මගින් සමාජයන් ස්වයංක්‍රීය ව උසස් යහපත කරා ගමන් කරන බවක් කිසිදු ලෙසකින් නොකියවේ.

කෙසේ වුව ද කාන්ට් හැදෑරීම ඉතා වැදගත් වන්නේ ඉහත දක්වන ලද සංකේතය නම් ක්‍රියාව සඳහා වූ සියලු සමාජවල සුවිශේෂතා ඉක්මවා යන්නා වූ විශ්වීය වටිනාකම් ගොඩ නැඟීම පිළිබඳ ව අතිශයින් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද නූතන චින්තකයෙක් වන බැවිණි. සියලු සබුද්ධික ජීවීන් (rational beings)

අරමුණු කර ගනිමින් කාන්ට් ගොඩ නඟන දර්ශනය එකී මිනිසුන්ගේ ස්වභාවයට හා සන්දර්භයන් වලට සීමා නොවෙමින්, ඒවා ඉක්මවා යමින් හා පොදු ඥාණනය කිරීමක් (common rational cognition) ඔස්සේ සියලු ලෝකවාසී මිනිසුන් සඳහා එක් අවබෝධයක් තුළ ඒකාත්මික අත්දැකීමක් (unified experience) අනුභූතිකාව අත්විඳීමට ඉඩ සැලසීම වෙනුවෙන් සංකල්පීයකරණය සැබෑ දාර්ශනික උත්සාහයක් විය හැකි බව කාන්ට් අවධාරණය කරන්නේ සත්‍ය ලෙස ම විශ්වීය දාර්ශනිකයෙක් ලෙසිනි. කාන්ටියානු සදාචාර නීතය අවසන් විශ්වීය ව්‍යපෘතියක් ලෙස හඳුන්වන ඇලන් වුඩ්(1999:327) කාන්ට්ගේ වැදගත් අදහසක් මෙසේ සම්පිණ්ඩනය කරයි.

> "ඉතිහාසයට ඇති වන්දනීය බැඳීම තුළ පදනම් වීම හෝ ස්වයං-ලාභය, උපක්‍රමශීලී හෙට්ටුකරණය හා සුරා කෑම ඔස්සේ මිනිසුන් සම්බන්ධ කරන, සෑම කල්හි ම වෙනස්වන ජාලයක් සාමූහික අරමුණු හඹා යෑම පිනිස වූ යහපත් මොඩලයක් නොවේ. වැඩිහිටි මිනිසුන් අතර සැබෑ ඒකමිතියක් (solidarity) වර්ධනය වනු ඇත්තේ දිගින් දිගට පවත්වා ගෙන යන අවබෝධාත්මක හා නිදහස් සන්නිවේදනයක් තුළ විශ්වීය වලංගුතාවකින් හා අන්තර්ගතයකින් සමන්විත විශ්වීය මූලධර්ම වෙනුවෙන් කෙරෙන්නා වූ අන්‍යෝන්‍ය කැප කිරීමක් (shared commitment) මගිනි (වුඩ් 1999: 326).

කාන්ට්ගේ විශ්වීය මූලධර්මයන් හරහා විශ්වීය මිනිස් සමාජයට එකට බැඳ තබන 'කේවල සමාජ සමස්තයක්' (single social whole) වන පොදු මිනිස් දෛවයක් ගොඩනඟන්නා වූ සබුද්ධික සැලැස්මක් (rational plan) යම් දවසක ඇති කර ගැනීම පිළිබඳව වූ කාන්ටියානු දර්ශනය වඩා සවිස්තර ව සහ විස්තෘත ව ඉදිරිපත් කරන ඇලන් වුඩ්(1999:336) පවසන්නේ ඒ සඳහා අද දවසේ අපට දක්නට ඇත්තේ එවන් සුදානමක් ඇති සමාජයන්හි ඛණ්ඩිත කොටස් පමණක් බවත් එම විසිරුණු කොටස් අප පරීක්ෂාකාරීව, බීජ රෝපණය කර ඒවා රැකබලා ගන්නා සේම, පෝෂණය කර යම් මතු දිනක පොදු විශ්වීයත්වයක් ඇති වනු සුබවාදී ව බලාපොරොත්තු විය යුතු බවයි. අද්‍යතනයේ කෙළවරක් නැති වාණිජ සංඥා විශ්වයක ගිලමට බල කරන විශ්වීය වටිනාකම් අවිශ්වාස කිරීමට පොළඹවන, නීතිය රැකීමට නොව යුගයක පශ්චාත්-පුනරුද මිනිසාගේ කාන්ටියානු වගකීම වනු ඇත්තේ එයයි. කාන්ට් සිය ඉගැන්වීමේ වෘත්තියේ අවසාන භාගයේ මානවවංශ විද්‍යාව සම්බන්ධ දේශනයක දී දැක් වූ අදහසක් උපුටා දක්වමින් ඇලන් වුඩ් සිය ග්‍රන්ථය නිමා කරයි.

> "[මිනිසා තුළ ඇති] නපුර සඳහා යොමුවීමේ ශක්‍යතාවයට එරෙහිව ක්‍රියා කරද්දී අපගේ අභිප්‍රාය ඇත්තේ සාමාන්‍ය යහපත තුළ වුවත් අපගේ අභිප්‍රාය මුදුන් පමණවා ගැනීම වඩාත් දුෂ්කර වනුයේ එය පුද්ගලයන්ගේ නිදහස් එකඟතාවය හරහා නොව විශ්වීය ලෙස ඒකාරාශි වූ වර්ගයාගෙන් සැදුම්ලත් පද්ධතියක් දෙසට මිහිතලයේ පුරවැසියන්ගේ ප්‍රගතිගාමී සංවිධානයක් හරහා එම අවසානය අත්පත් කර ගත යුතු විමයි" (කාන්ට් 1964:333).

තවමත් අප ජීවත් වන ලෝකය මෙම සබුද්ධික වැඩිහිටි මිනිසා හරහා ගොඩනඟා ගත යුතු නපුරෙන් තොර යහපත් ලෝකය නීතියට බාහිරින් ගමන් කරමින්

නොව නීතියට එකඟව ඒ හරහා ගමන් කිරීමෙන් පමණක් පුද්ගල ආශාව සන්තර්පණය කර ගත යුතු වේ. මීට පටහැනි ව නීතිය උල්ලංඝණය කිරීමෙන් ලැබෙන්නේ විපරීත සතුටකි. අද පාරිභෝගික විනෝද යුගය තුළ කියවෙන්නේ සියල්ල උල්ලංඝණය කරන ලෙසයි. උදාහරණ ලෙස එක්තරා ජංගම දුරකථන දැන්වීමක පෙන්වෙන්නේ විනයගතව අධ්‍යයන කටයුතු කරමින් සිටින උසස් අධ්‍යාපනික විද්‍යාගාරයක එකවරම සැමටම බාධාවන පරිදි පර්යේෂණාගාර උපකරනවලට තට්ටු කරමින් සංගීතයක නියැලෙන තරුණයෙක් පෙන්වයි. ඒ හඬට අනුගත වන අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද ගීත ගැයීමට හා නැටීමට පටන් ගනිති. අනතුරු ව තම පංතිය තුළ ශිෂ්‍ය හැසිරීම නියාමණය (regulate) කිරීමට බලය ඇති ගුරුවරිය ද එය නවත්වනවා වෙනුවට ඇය ද ඒ හඬ අනුකරණය කරමින් මිමිණීමට හා නැටීමට පටන් ගනී. තව දහස් ගණනක් වෙළඳ දැන්වීම වල තත්වය ද මෙයයි. සමස්ත පාසැල් පංතියම අර්බුදයකට යයි. විනෝදයේ සීමාවක් නැත. මෙය විපරීත තත්වයක් වන්නේ විනය සකස් කිරීමට සිටින්නා වූ තැනැත්තා සතු බලය මෙහිදී පාරිභෝගික විශ්වයක් තුළ නපුංසක (impotent) නිෂ්ක්‍රීය බලයක් වීම මෙන් ම තමා විසින් ම රැකගැනීමට ඇති ව්‍යුහය තමා විසින්ම උල්ලංඝනය කිරීමට පොළඹවීම තුළයි.

අද දවසේ කාන්ටියානු ආදර්ශනය තුළ වෛද්‍ය විද්‍යාලයට ගොස් වෛද්‍යවරයෙකු වනවා වෙනුවට මුදල් හා බලය හරහා විභාග බයිපාස් කිරීම, නීති විද්‍යාලවල සිදුවන අක්‍රමිකතා, විභාග වංචා, අනිසි ලකුණු ලබා දීම්, ස්ත්‍රී වසඟය තුළ පක්ෂග්‍රාහීත්වය, දේශපාලන බලය හා හොර සහතික තුළ ඇගයීම් ක්‍රම (testing and evaluation) අර්බුදයට යෑම මෙන් ම ඇගයීම් ක්‍රම හිතුමතේ වෙනස් කිරීම යන තත්වයන් හරහා (අවම වශයෙන් ලාංකික සන්දර්භය තුළ) පූර්ව කොන්දේසි බරපතල ලෙස උල්ලංඝනය වීමක් සිදු වේ. මීට අමතර ව අවශ්‍ය විදියට උපාධි ලබා දෙන විවිධ පන්නයේ උපාධි කඩ ද වර්ධනය වෙමින් තිබේ. අද දවසේ මට වෛද්‍යවරයෙකු වීමට අවශ්‍ය නම් බල්ලන් මරා හෝ සල්ලි හම්බ කර එම මුදල් අතැතිව ක්‍රමයේ දූෂිත කොරිඩෝ හරහා ගමන් කළ යුතුය. දැන් ඔබ දක්ෂ වෛද්‍යවරයෙකි!

ඉහත ආදර්ශනය නිපදවා ගැනීමට නොහැකි වීමත් පශ්චාත්-පුනරුද ඥානය, අවබෝධය හා සංකල්පනය පුළුල් කර ගත් සබුද්ධික මිනිසා මූලික කොටගත් නූතන ලෝකය තුළ නාසිවාදය ඒකාධිපතිවාදයන් ලෝක යුධ අමානුෂිකත්වය හා තවත් අනේක වූ අසමානතාවන් හා අසාධාරණයන් සිදුවන්නේ ඇයි දැයි යන ප්‍රශ්නයට සර්ගන් හබමාස් 'නූතනත්වය නො-අවසන් ව්‍යාපෘතියක්' ලෙසට නම් කරන්නෙත් මෙම කාන්ටියානු විශ්වීය ව්‍යාපෘතිය පූර්ණත්වයක් අත්පත් කර ගන්නා දිනය පිළිබඳ සිහිනය සිත් හි දරා ගනිමිනි. ඒ අයුරින් සිතන කල්හි කාන්ටියානු හබමාසියානු කතිකාව තවදුරටත් ඉදිරියට ගෙන යෑම අද දවසේ අවශ්‍යතාවක් ලෙස දැක්විය හැකි ය.

නිගමනය

මිනිස් නිදහස හා සමානාත්මතාව දිනා ගැනීම සඳහා භෞතික වැඩපිළිවෙළක්, මිනිසුන් සංවිධානය කිරීම හා දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වන අතර එය ආචාර ධාර්මික ගුප්ත හැඟවුම ක්‍රියාත්මක වීම පිළිබඳ පරිකල්පන කර පමණක් දැක්විය

නොහැක. නමුත් කැසබලන්කා චිත්‍රපටය වඩා විශ්විය යහපතක් මිනිස් අවිඥානය තුළ සැඟවුණු ඒජන්තයෙක් ලෙස ක්‍රියා කිරීම හරහා වඩා සබුද්ධික සාධාරණ හා පිළිවෙළ ලෝකයක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් මිනිසා තමාට ආවේණික අයුරකින් සටන් කිරීම පිළිබඳ සම්භාව්‍ය උදාහරණයක් සපයයි. මහේෂ්ක නිදහස් සටනක දී කේවල පුද්ගල සුවිශේෂතා මතින් ඇති කරන්නා වූ සංකීර්ණතා සමඟ විමුක්ති ව්‍යාපාර ගනුදෙනු කිරීමේ දී ජනප්‍රිය අයුරින් බලාපොරොත්තුවන අධිනිශ්චිත රැඩිකල් සටන්කාමීත්වය වෙනුවට වඩා සංකීර්ණ ව්‍යුහාත්මක තත්වයන් පිළිබඳ හැඟවුමක් චිත්‍රපටය ඇති කරන බැවින් මහේෂ්ක මැදිහත්වීම් පිළිබඳ සාමාන්‍ය (streroetype) රූපයට අනුගත මිනිසෙක් රෝමාන්තික සටන්කාමී භාවිතයන් පිළිබඳ පොදු රැඩිකල් සරලකරනය මෙහි දී අභියෝගයට ලක් වේ. වඩා යහපත් ලොවක් තනා ගැනීම පිළිබඳ හැඟවුම වඩා බලවත් වාණිජ යථාර්ථයක දී වුව ද අත්හැර දැමීම යුතු ව්‍යාපාරයක් නොව ඉතාම දුෂ්කර තත්වයන් යටතේ වුව ද ඉදිරියට ගෙන යා යුතු බව කැසබලන්කා චිත්‍රපටය කාන්ටියානු හැදෑරීමක් යටතේ ප්‍රති-සන්දර්භගතකරණය කරද්දී පැහැදිලිවන කරුණකි. සදාචාර නීතිය පිළිබඳ අවබෝධය විසින් අප සමාජයක් ලෙස එකට බැඳ තබන්නේ කෙසේ ද යන්නත් වඩා විශ්වීය වටිනාකම් වෙනුවෙන් පුද්ගල අත්මාර්ථය පසෙකලා කටයුතු කිරීම පිළිබඳ විශ්වීය හැඟවුමක් ජනිත කිරීමත් චිත්‍රපටය හැදෑරීම තුළ මතුවන අනෙක් වැදගත් කරුණකි. පශ්චාත් නූතන අරාජක, අවිනිශ්චිත බලාපොරොත්තු රහිත බව වෙනුවට නිදහස් මිනිසාගේ ජයග්‍රහණය පිළිබඳ සංඥාවක් ජනිත කිරීම මගින් අනාගත යහපත පිළිබඳ බලාපොරොත්තුවක් දල්වා ගැනීමට නූතන අර්ථයකින් ඉඩකඩක් සපයා දීම චිත්‍රපටයේ වැදගත් දේශපාලනික සාධකයකි. පශ්චාත්-පුනරුද මිනිසා තේරුම් ගැනීම සඳහා කාන්ටියානු දර්ශනය තවමත් අදාළ කරගත හැකි බවත් ඇතැම් තත්වයන් මාක්ස්වාදය යටතේ වඩාත් පැහැදිලි කර ගන්නා විට පුද්ගල වගකීම හා ආශාව-සටන්කාමීත්වය-යහපත පිළිබඳ පරමාදර්ශය විසින් මිනිසා මෙහෙයවීම යන තත්වයන් කාන්ටියානු දර්ශනය හරහා පැහැදිලි කර ගත හැකි බව ද මෙහි දී එළිදරව් වන තවත් කරුණකි. සියල්ලටමත් වඩා පශ්චාත්-පුනරුද නිදහස් (නමුත් ආචාරධාර්මික) මිනිසා පිළිබඳ අතිවිශිෂ්ට නිර්වචනීය සොයා ගැනීමක් කළ එමදනුවෙල් කාන්ට් නම් දාර්ශනිකයාගේ යහපත නිදහස හා සමානාත්මතාව පිළිබඳ ගැඹුරු සංකල්ප හැදෑරීම සඳහා උත්ප්‍රේරණයක් ලබා දීමට ලාංකික සන්දර්භයක් තුළ මෙම ලියවිල්ල සමත්විත නම් එය එක්තරා ආකාරයක දේශපාලනික ජයග්‍රහණයකි. තම සුවිශේෂ පුද්ගල අනන්‍යතා සිඳ ගනිමින්, කොදු නාරටිය බිඳගත් මිනිසුන් තමා ළඟට එනු දැකීම අභිමත ලොවක කාන්ට් මෙසේ පවසයි.

> 'බොහෝ මිනිස්සු සත්ක්‍රියා කිරීම මගින් සතුටු වන නමුත් අනෙකාට බැඳී සිටිම වෙනුවෙන් පෙනී සිටීමට කැමැත්තක් නොදක්වති. යමෙක් යටහත් පහත්ව ඔවුන් ළඟට එන්නේ නම් එවිට ඔවුන් ඕනෑම දෙයක් කරයි. නමුත් ඔවුන්ට මිනිසුන්ගේ අයිතිය වෙනුවෙන් විෂය වීමට අවශ්‍ය නැති අතර ඔවුන් ඔවුන්ව ම දකින්නේ උදාර මහත්මා ගතියක වස්තුන් ලෙසිනි. කුමන නමක් යටතේ මා යමක් ගනී ද යන්න එක සමාන නොවේ. මට නියම වශයෙන් අයිති දෙය මට ප්‍රදානය කළ යුත්තේ මා හුදෙක් යහපත් ව ඉල්ලා සිටින දෙයක් ලෙස නොවේ' (කාන්ට් 1964: 145).

පරිශීලිත මූලාශ්‍රය

Eco, Umberto (1985) *Casablanca: Cult Movies and Intertextual Collage. In Search of Eco's Rose*, in *Substance*, USA, University of Wisconsin Press.

Fromm, Erich (2004) *The Dogma of Christ*, London, Routledge.

Harbermas, J. (1981). *Modernity: An Unfinished Project*, USA, MIT Press.

Kant, Immaneul (1905) *Critique of Pure Reason*, London, Penguine.

Kant, Immaneul (1964) *Groundwork of the Metaphysics of Morals* (trans. H.J. Paton), New York, Harper & Row.

Kant, Immaneul (1997) *Lectures on Ethics*, (Ed. Paul Guyer & Allen W. Wood), London, Cambridge University Press.

Lyotard, J.F. (1984) *The Postmodern Conditions: A Report on Knowledge*, USA, Manchester University Press.

Robertson, Janes C. (1993) *The Casablanca Man: The Cinema of Michael Curtiz*, London, Routledge.

Taylor, Paul A (2011) *Zizek and the Media*, USA, Polity.

Wood, Allen W. (1999) *Kant's Ethical Thought*, London, Oxford Univresity Press.

Weinninger, Otto (2000) *Sex and Character*, USA, The University of Chicago Press.

Zizek, Slavoj (1989) *The Sublime Object of Ideology*, London, Verso 109-110.

Zizek, Slavoj (1994) *The Metastases & Enjoyment*, London, Verso.

Zizek, Slavoj (2001) *Enjoy Your Symptom: Jacques Lacan in Hollywood and Out*, London, Routledge.

Zizek, Slavoj (2002) *For They Know not What They Do: Enjoyment as a Political Factor*, London, Verso.

Zizek, Slavoj (2005) *Interrogating Real*, London, Verso.

Zizek, Slavoj (2011) *Living in the End Times*, London, Vers